
# ජපානයේ විදේශීය ශිෂ්‍ය ජීවිතය පිළිබඳ පූර්ව දැනුම 2023

**ජපානයේ විදේශීය ශිෂ්‍ය ජීවිතය පිළිබඳ පූර්ව දැනුම**
**2023**



CONTENTS

## I. ජපානයේ අධ්‍යාපනය ලැබීමට සූදානම් විය යුත්තේ කෙසේද?


01 ජපානයේ පාසල් පද්ධතිය කුමන අයුරුද? 2
02 දැනට ජපානයේ විදේශීය ශිෂ්‍යයන් කෙතරම් සිටීද? 2
03 විදේශීය ශිෂ්‍යයන් ජපානයේ අධ්‍යාපනය ලැබීමට සපුරාලිය යුතු කොන්දේසි තිබේද? 3
04 පාඨමාලා ගාස්තුව කොපමණ වේද? 4
05 නේවාසික පදිංචි (තත්ව) සුදුසුකම (වීසා ස්ටේටස් එක) යනු කුමක්ද? ජපානයේ අධ්‍යාපනය ලැබීමට විදේශීය ශිෂ්‍යයන් හට අවශ්‍ය වන නේවාසික පදිංචි සුදුසුකම කුමක්ද? 4


## II. ජපානයේ අධ්‍යාපන ආයතනයක් තෝරා ගන්නේ කෙසේද?


01 ජපන් භාෂා අධ්‍යයන ආයතනයක් යනු කුමන ආකාරයේ පාසලක්ද? 5
02 පශ්චාත් උපාධි ආයතනයකට ඇතුළත් වන්නේ කෙසේද? 6
03 විශ්වවිද්‍යාලයකට ඇතුළත් වන්නේ කෙසේද? 6
04 කෙටි කාලීන විශ්වවිද්‍යාලයකට ඇතුළත් වන්නේ කෙසේද? 6
05 තාක්ෂණ අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වන්නේ කෙසේද? 6
06 වෘත්තීය පුහුණු ආයතනයක වෘත්තීය පාඨමාලාවකට (වෘත්තීය අධ්‍යාපන ආයතනයකට) ඇතුළත් වන්නේ කෙසේද? 7
07 ශිෂ්‍යත්ව ක්‍රමවේද තිබේද? 7
08 ජපානයේ රැකියාවක් ලබා ගත හැකිද? 7



## III. ජපානයේ ජීවත් වීම ගැටලුවක් නොවන්නේද?


01 නේවාසික පදිංචි කාඩ්පතක් යනු කුමක්ද? 8
02 ජපානයේ ජීවත් වීමට කොපමණ මුදලක් වැය වේද? 9
03 විදේශීය ශිෂ්‍යයන්ට අර්ධකාලීනව රැකියා කළ හැකිද? 10
04 විදුලිය, ගෑස්, ජලය, දුරකථන යනාදිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටි කෙසේ සිදු කළ යුතුද? 11
05 කෙදිනක, කෙසේ කසළ බැහැර කරන්නේ ද? (කසළ සහ ප්‍රතිචක්‍රීකරණය) 11
06 හදිසි අවස්ථාවක දී කළ යුත්තේ කුමක්ද? 11
07 ජපන් සෞඛ්‍ය රක්ෂණය/ විශ්‍රාම වැටුප් සඳහා ලියාපදිංචි විය යුතුද? 11
08 මයි නම්බර් එක යනු කුමක්ද? 12
09 ජපානයේ අධ්‍යාපනය ලබන කාලයේදී කුමන ආකාරයේ ක්‍රියා පටිපාටි සිදුකළ යුතුද? 12
10 විදේශීය ශිෂ්‍යයන් අවධානයෙන් සිටිය යුතු කරුණු මොනවාද? 13
11 නව කොරෝනා වෛරසය ආසාදනය වුවහොත් කළ යුතු දේ 14

# I. ජපානයේ අධ්‍යාපනය ලැබීමට සූදානම් විය යුත්තේ කෙසේද?

## 01 ▸ ජපානයේ පාසල් පද්ධතිය කුමන අයුරුද?

ජපානයේ පාසල් පද්ධති ක්‍රමවේදය වසර 6 ක ප්‍රාථමික අධ්‍යාපනයක්, වසර 3 ක ද්විතීයික අධ්‍යාපනයක් සහ වසර 3 ක උසස් පෙළ අධ්‍යාපනයකින් සමන්විත වේ. තවද, උසස් අධ්‍යාපන ආයතන ලෙස පශ්චාත් උපාධි ආයතන, විශ්වවිද්‍යාල, කෙටි කාලීන විශ්වවිද්‍යාල, තාක්ෂණ අධ්‍යාපන ආයතන සහ වෘත්තීය අධ්‍යාපන ආයතන ඇත. ජපානයේ පාසල් හි අධ්‍යන වර්ෂය, අප්‍රේල් මාසයෙන් ආරම්භ වී මාර්තු මාසයෙන් අවසන් වේ. (ඇතැම් පාසල් ඔක්තෝබර් මාසයෙන් ආරම්භ වී සැප්තැම්බර් මාසයෙන් අවසන් වේ).




*** අනිවාර්ය අධ්‍යාපනය වසර 6ක ප්‍රාථමික අධ්‍යාපනය සහ වසර 3ක ද්විතීය අධ්‍යාපනය එක්වූ වසර 9කි.**

## 02 ▸ දැනට ජපානයේ විදේශීය ශිෂ්‍යයන් කෙතරම් සිටීද?

උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන විදේශීය ශිෂ්‍යයන් ගණන 181,741කි. මීට අමතරව, උසස් අධ්‍යාපන ආයතනයන්ට ඇතුලත් වීම සඳහා ජපන් භාෂා අධ්‍යයන ආයතනවල ජපන් භාෂාව හදාරමින් සිටින ශිෂ්‍යයන් ගණන 49,405ක් වන අතර, එකතුව 231,146 ක් වේ (2022 මැයි වන විට).

**එක් එක් ආයතනය අනුව විදේශීය ශිෂ්‍යයන් සංඛ්‍යාව**

| | |
|---|---|
| පශ්චාත් උපාධි ආයතන | 53,122 |
| විශ්වවිද්‍යාල (උපාධි) | 72,047 |
| කෙටි කාලීන විශ්වවිද්‍යාල | 1,863 |
| තාක්ෂණ අධ්‍යාපන ආයතන | 480 |
| වෘත්තීය අධ්‍යාපන ආයතන | 51,955 |
| පෙර සූදානම් පාඨමාලාව * | 2,274 |
| ජපන් භාෂා අධ්‍යයන ආයතන | 49,405 |

**ප්‍රධාන මව්රටවල් සහ කලාප අනුව විදේශීය ශිෂ්‍යයන් සංඛ්‍යාව (ජපන් භාෂා අධ්‍යයන ආයතන ඇතුළුව)**

| | |
|---|---|
| චීනය | 103,882 |
| වියට්නාමය | 37,405 |
| නේපාලය | 24,257 |
| කොරියාව | 13,701 |
| ඉන්දුනීසියාව | 5,763 |
| තායිවානය | 5,015 |
| ශ්‍රී ලංකාව | 3,857 |

* පෙර සූදානම් පාඨමාලාව යනු තම මව් රටේ වසර 12 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකළ පුද්ගලයන්ට උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීම සඳහා සූදානම් කිරීමේ පාඨමාලාවකි

(ගණනය කිරීම් ජපන් ශිෂ්‍ය උපකාරක සංවිධානයේ පර්යේෂණ මත පදනම් වේ)

## 03 ▸ විදේශීය ශිෂ්‍යයන් ජපානයේ අධ්‍යාපනය ලැබීමට සපුරාලිය යුතු කොන්දේසි තිබේද?

මූලික වශයෙන්, උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට නම්, මව් රට ආදියෙහි වසර 12ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය. එය වසර 12 කට අඩු නම්, "පෙර සූදානම් පාඨමාලාවක්" හදාරා එය සම්පූර්ණ කළ යුතුය. තවද, පශ්චාත් උපාධි ආයතනයකට ඇතුලත් වීම සඳහා විශ්වවිද්‍යාල උපාධියක් වැනි දෑ සම්පූර්ණ කර තිබිය යුතු වේ.

ජපානයේ උසස් අධ්‍යාපන ආයතන, ඇතැමක හැර ජපන් භාෂාවෙන් ඉගැන්වීම් සිදුකෙරේ (ඇතැමක ඉංග්‍රීසියෙන් සිදු කෙරේ). එබැවින්, විදේශීය ශිෂ්‍යයන්ට ජපානයේ අධ්‍යාපනය ලැබීමට ජපන් භාෂා හැකියාව අවශ්‍ය වේ. උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට නම්, ඊට පෙර ජපන් භාෂා අධ්‍යයන ආයතනයකින් ජපන් භාෂාව හැදෑරීම (මාස 6 සිට අවුරුදු 2 දක්වා) සාමාන්‍ය ක්‍රමය වේ. ජපන් භාෂා ප්‍රවීණතාවය ඇති අයට, ජපන් භාෂා අධ්‍යයන ආයතනයක් හරහා නොගොස් කෙලින්ම උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමද කල හැකිය. එවැනි අවස්ථාවල දී අවශ්‍ය වන ජපන් භාෂා ප්‍රවීණතා ප්‍රමිතිය අධ්‍යාපන ආයතනය අනුව වෙනස් වන බැවින් කරුණාකර සෝදිසි කර බලන්න.

ජපන් භාෂා ප්‍රවීණතාවය මැනීමට පරීක්ෂණයක් ලෙස "ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය" ඇත. තවද, විශ්වවිද්‍යාල ආදිය වෙත ප්‍රවේශ වීම සඳහා තෝරාගැනීමේ විභාගයක් ලෙස "ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගය" ඇත. මීට අමතරව, ව්‍යාපාරික අවස්ථා වලදී අවශ්‍ය ජපන් භාෂා ප්‍රවීණතාවය මැනීමට "BJT ව්‍යාපාර සඳහා ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය" ඇත.

① ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (JLPT)

විදේශිකයන්ගේ ජපන් භාෂා ප්‍රවීණතාවය සහතික කරන පරීක්ෂණයක් ලෙස, ජපානය තුල නම් ජපන් ජාත්‍යන්තර අධ්‍යාපන උපකාරක සංගමය මගින්, ජපානයෙන් පිටත නම් ජාත්‍යන්තර හුවමාරු සඳහා වන ජපාන පදනම මගින් "ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය" පවත්වනු ලැබේ. එය ජපානයේ විවිධ ප්‍රදේශවල සහ ජපානයෙන් පිටත විවිධ රටවල/ කලාපවල ජූලි සහ දෙසැම්බර් මාසවල, වසරකට දෙවරක් පවත්වනු ලැබේ. පරීක්ෂණ මධ්‍යස්ථාන සඳහා කරුණාකර JLPT වෙබ් අඩවිය බලන්න.

② ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගය (EJU)

ජපානයේ විශ්වවිද්‍යාල ආදියට ඇතුලත් වීම සඳහා වන ප්‍රවේශ විභාගයක් ලෙස, ජපන් ශිෂ්‍ය උපකාරක සංවිධානය විසින් පවත්වනු ලැබේ. මෙම විභාගය, ජපානයට පැමිණීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශ අනුමැතිය ලබා දීම අරමුණු කරගෙන, ජුනි සහ නොවැම්බර් ලෙස වසරකට දෙවරක් ජපානයේ විවිධ ප්‍රදේශවල සහ ජපානයෙන් පිටත වෙනත් රටවල/ කලාපවල පවත්වනු ලැබේ. විභාග විෂයයන් වන්නේ ජපන් භාෂාව, ගණිතය, විද්‍යාව (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව අතරින් තෝරාගත් විෂයයන් 2ක්) සහ සාමාන්‍ය විෂයයන්ය. පරීක්ෂණ මධ්‍යස්ථාන සඳහා කරුණාකර EJU වෙබ් අඩවිය බලන්න.

* චීනයේ පවත්වනු නොලැබේ.


③ BJT ව්‍යාපාර ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය

BJT ව්‍යාපාර ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත්තේ ජපන් භාෂාව තම මව් භාෂාව ලෙස නොව, විදේශ භාෂාවක් හෝ දෙවන භාෂාවක් ලෙස ඉගෙන ගන්නා ව්‍යාපාරිකයින් සඳහා ය. මෙම පරීක්ෂණයේදී, විවිධ ව්‍යාපාරික අවස්ථා තුළ "ජපන් භාෂාව භාවිතයෙන් සන්නිවේදන ප්‍රවීණතාව" විෂය අනුබද්ධව මැනීම සහ ඇගයීමට ලක් කෙරේ. ජපානයේ කන්ජි යෝග්‍යතා පරීක්ෂණ සංගමය විසින් එයට අනුග්‍රහය දක්වන අතර, ජපානයේ විවිධ ප්‍රදේශවල සහ ජපානයෙන් පිටත වෙනත් රටවල /කලාපවල CBT (Computer Based Testing, පරිගණක ආධාරක පරීක්ෂණ) ක්‍රමය භාවිතයෙන් අවශ්‍ය පරිදි පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය, සවන්දීමේ අවබෝධතා ප්‍රශ්න, සවන්දීමේ කියවීමේ අවබෝධතා ප්‍රශ්න සහ කියවීමේ අවබෝධතා ප්‍රශ්න වලින් සමන්විත වේ.

පරීක්ෂණ ප්‍රතිඵලය සමත් හෝ අසමත් ලෙස නොව, 0 සිට 800 දක්වා ලකුණු ලැබෙන අතර, J5 සිට J1 + ලෙස මට්ටම් 6 කින් ඇගයීමට ලක් කෙරේ.

අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව වෙනත් කොන්දේසි ලෙස, ජපානයේ අධ්‍යාපනය ලබන කාලය තුල පාඨමාලා ගාස්තුව සහ ජීවන වියදම ගෙවීමට ප්‍රමාණවත් හැකියාවක් තිබීම, ශිෂ්‍යත්ව හෝ වෙනත් ක්‍රම තිබීම අවශ්‍ය වේ.






## 04 ▸ පාඨමාලා ගාස්තුව කොපමණ වේද?

ජපානයේ විශ්වවිද්‍යාලයකට, කෙටි කාලීන විශ්වවිද්‍යාලයකට හෝ වෘත්තීය අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට, එක් එක් පාසල සඳහා සාමාන්‍යයෙන් පහත වගුවේ දක්වා ඇති ගාස්තු අවශ්‍ය වේ. මෙම ගාස්තුව යනු පළමු වසරේ ගෙවීම (පළමු වන වසර) වන අතර, ප්‍රවේශ ගාස්තු, පාඨමාලා ගාස්තු, පහසුකම් හා නඩත්තු ගාස්තු යනාදිය ඇතුළත් වේ. දෙවන වසරේ සහ ඉන් පසුව, ඇතුළත් වීමේ ගාස්තු අය නොකෙරේ.

මෙය දළ අගයක් පමණි. ඔබ බලාපොරොත්තු වන පාසල්වල පිරිවැය සඳහා කරුණාකර වෙන වෙනම පරීක්ෂා කරන්න.

| | අධ්‍යාපන ආයතන | ක්ෂේත්‍රය | මුල් වසර සඳහා වාර්ෂික පිරිවැය |
|---|---|---|---|
| ① | පෞද්ගලික විශ්වවිද්‍යාල | විද්‍යා අංශය | යෙන් මිලියන 1.57 ක් පමණ (* වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අංශය හැර) |
| | | කලා අංශය | යෙන් මිලියන 1.19 ක් පමණ |
| ② | පෞද්ගලික කෙටි කාලීන විශ්වවිද්‍යාල | සියලුම අංශ | යෙන් මිලියන 1.13 ක් පමණ |
| ③ | වෘත්තීය අධ්‍යාපන ආයතන | කාර්මික අංශය | යෙන් මිලියන 1.29 ක් පමණ |
| | | වාණිජ අංශය | යෙන් මිලියන 1.14 ක් පමණ |
| | | විලාසිතා අංශය | යෙන් මිලියන 1.15 ක් පමණ |
| | | සංස්කෘතික/ අධ්‍යාපන අංශය | යෙන් මිලියන 1.22 ක් පමණ |
| ④ | ජපන් භාෂා අධ්‍යයන ආයතන | ජපන් භාෂා අධ්‍යයනය | යෙන් මිලියන 0.76 ක් පමණ |

(ගාස්තු ① සහ ② සඳහා, අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 වසරේ සමීක්ෂණයට අනුව, ③ සඳහා, ටෝකියෝ වෘත්තීය විවිධ පාසල් සංගමයේ 2022 වසරේ සමීක්ෂණයට අනුව සහ ④ සඳහා, ජපන් භාෂා අධ්‍යාපන ප්‍රවර්ධන සංගමයේ සමීකෂණයන්ට අනුව වේ)

## 05 ▸ නේවාසික පදිංචි (තත්ව) සුදුසුකම (වීසා ස්ටේටස් එක) යනු කුමක්ද? ජපානයේ අධ්‍යාපනය ලැබීමට විදේශීය ශිෂ්‍යයන් හට අවශ්‍ය වන නේවාසික පදිංචි සුදුසුකම කුමක්ද?

නේවාසික පදිංචි සුදුසුකම යනු, ජපානයේදී සිදුකරන කාර්යයන්ට අනුව, ජපානයේ නේවාසිකව පදිංචි වීමට ලබා දෙන සුදුසුකමක් වේ. ජපානයේ අධ්‍යාපනය ලබන විට, නේවාසික පදිංචි සුදුසුකම "留学 (විදේශීය ශිෂ්‍ය)" වනු ඇත.

| නේවාසික පදිංචි සුදුසුකම | අන්තර්ගතය |
|---|---|
| "විදේශීය ශිෂ්‍ය" | පශ්චාත් උපාධි ආයතන, විශ්වවිද්‍යාල, කෙටි කාලීන විශ්වවිද්‍යාල, තාක්ෂණ අධ්‍යාපන ආයතන, උසස් පෙළ පාසල්, ද්විතීය පාසල්, ප්‍රාථමික පාසල්, වෘත්තීය අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාල/ කෙටි කාලීන විශ්වවිද්‍යාල වල විදේශීය ශිෂ්‍යයන් සඳහා වන විශේෂ පාඨමාලා, විවිධ පාසල්වල පෙර සූදානම් පාඨමාලා, ජපන් භාෂා පාසල් ආදී ජපන් භාෂා අධ්‍යයන ආයතනවලට ඇතුළත් වූ විට ලබා දෙන නේවාසික පදිංචි සුදුසුකම.<br>නේවාසික පදිංචි කාලය: අධිකරණ අමාත්‍යවරයා විසින් වෙන වෙනම නියම කරන ලද කාල සීමාව (වසර 4 යි මාස 3 නොඉක්මවන කාල සීමාවක්) |

ජපානයට අධ්‍යාපනය සඳහා පැමිණෙන විට, ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයෙන් (ආගමන විගමන නේවාසික පදිංචි කළමනාකරණ කාර්යාංශයෙන්) "නේවාසික පදිංචි සුදුසුකම පිළිබඳ යෝග්‍යතා සහතිකයක්" කල්තියා නිකුත් කර ඇත්නම්, කෙටි කාලයක් තුළ වීසා (VISA) ලබා ගත හැකිය. ජපානයට ඇතුළු වීමට පෙර, ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට (අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය, ආදිය) ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයෙන් "නේවාසික පදිංචි සුදුසුකම පිළිබඳ යෝග්‍යතා සහතිකය" සඳහා ඉල්ලුම් කළ හැක.

* "විදේශීය ශිෂ්‍ය" සඳහා මාස 3ක නේවාසික පදිංචි කාලය මූලික වශයෙන් අදාළ වන්නේ, විශ්වවිද්‍යාල සහ උසස්පෙළ පාසල්වල විදේශීය හුවමාරු ශිෂ්‍යයන් සඳහා වන අතර, ජපන් භාෂා අධ්‍යයන ආයතනයකට ඇතුලත් වීමේදී නේවාසික පදිංචි කාලය සාමාන්‍යයෙන් මාස 6 සිට වේ.
* අවශ්‍යතාවය අනුව, ජපානයට ඇතුළු වූ පසු නේවාසික පදිංචි කාලය අලුත් කර ගැනීම සඳහා ඉල්ලුම් කළ හැකිය. (P12 09 ① බලන්න)

# II. ජපානයේ අධ්‍යාපන ආයතනයක් තෝරා ගන්නේ කෙසේද?

විදේශීය ශිෂ්‍යයන් ජපානයේ අධ්‍යාපනය ලැබීමේදී, කුමන ආකාරයේ අධ්‍යාපන ආයතනයක කුමන අංශය තෝරා ගන්නේද යන්න, ජපානයේ දී ලබන අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට ඉතා වැදගත් කරුණක් වේ. මෙහිදී, එක් එක් අධ්‍යාපන ආයතනයේ ලක්ෂණ සහ ඇතුළත් වීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන්නෙමු.

## 01 ▶ ජපන් භාෂා අධ්‍යයන ආයතනයක් යනු කුමන ආකාරයේ පාසලක්ද?

පශ්චාත් උපාධි ආයතන, විශ්වවිද්‍යාල, කෙටි කාලීන විශ්වවිද්‍යාල, තාක්ෂණ අධ්‍යාපන ආයතන සහ වෘත්තීය අධ්‍යාපන ආයතන වලට ඇතුලත් වීමට පෙර, ජපන් භාෂාව ඉගෙන ගන්නා අධ්‍යාපන ආයතනයකි. ජපන් භාෂා අධ්‍යයන ආයතන පහත වගුවේ සඳහන් පරිදි විවිධ වර්ග තිබේ. ජපන් භාෂා අධ්‍යයන ආයතනයක "විදේශ ශිෂ්‍යය" නේවාසික පදිංචි සුදුසුකම ලබා ගැනීම සඳහා, අධිකරණ අමාත්‍යාංශය විසින් දැනුම් දෙන ලද ජපන් භාෂා අධ්‍යයන ආයතනයකට ඇතුළත් විය යුතුය (විශ්වවිද්‍යාල සහ කෙටි කාලීන විශ්වවිද්‍යාල වල විදේශ ශිෂ්‍යයන් සඳහා වන විශේෂ පාඨමාලා හැර). මෙම කරුණ අනිවාර්යයෙන් පරීක්ෂා කිරීමට වග බලා ගන්න.

| වර්ගය | අන්තර්ගතය |
|---|---|
| වෘත්තීය අධ්‍යාපන ආයතනයක ජපන් භාෂා පීඨය | වෘත්තීය අධ්‍යාපන ආයතනයක ජපන් භාෂා පීඨය. අධ්‍යයන කාලය වසර 1 සිට 2 දක්වා. |
| විවිධ අධ්‍යාපන ආයතනවල ජපන් භාෂා පාසල් | විවිධ අධ්‍යාපන ආයතන ලෙස සහිතක ලත් ජපන් භාෂා අධ්‍යයන ආයතන.<br>අධ්‍යයන කාලය මාස 6 සිට අවුරුදු 2 දක්වා වේ. |
| විවිධ අධ්‍යාපන ආයතන නොවන ජපන් භාෂා පාසල් | සංස්ථා, මහජන සුභසාධන ආයතන හෝ පුද්ගලයකු විසින් පවත්වාගෙන යනු ලබන ජපන් භාෂා පාසල්.<br>කෙටිකාලීන ජපන් භාෂා පාඨමාලාවල සිට විශ්වවිද්‍යාල ප්‍රවේශ පාඨමාලා දක්වා ඇත.<br>අධ්‍යයන කාලය මාස 6 සිට අවුරුදු 2 දක්වා වේ. |
| පෙර සූදානම් පාඨමාලාව | ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට වසර 12ක් ගත නොවන රටවල විදේශිකයන් හට විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබීම සඳහා, අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් නම් කරන ලද "විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පෙර සූදානම් අධ්‍යාපන පාඨමාලාව". ජපන් භාෂාවට අමතරව, ජපන් සංස්කෘතිය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ මූලික විෂයයන් අඩංගු වේ.<br>අධ්‍යයන කාලය වසර 1 සිට 2 දක්වා. |
| විශ්වවිද්‍යාල /කෙටි කාලීන විශ්වවිද්‍යාල විදේශීය ශිෂ්‍යයන් සඳහා විශේෂ | විශ්වවිද්‍යාල සහ කෙටි කාලීන විශ්වවිද්‍යාලවල පිහිටුවා ඇති විදේශිකයන් සඳහා වන පාඨමාලා. ජපන් භාෂාවට අමතරව, ජපන් සංස්කෘතිය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ මූලික විෂයයන් ද අඩංගු වේ. අධ්‍යයන කාලය වසරකි. |

ජපන් භාෂා අධ්‍යයන ආයතනයකට ඇතුළත් වීමේ මූලික කොන්දේසිය වන්නේ, වසර 12 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර ඇති හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකම් තිබීමයි. ඇතුළත් වීම සඳහා, සුදුසුකම් සහතික පරීක්ෂාවට අමතරව, සම්මුඛ පරීක්ෂණ ආදිය පවත්වනු ලැබේ. තවද, ඇතුළත් වීම සඳහා අවශ්‍ය වන ජපන් භාෂා ප්‍රවීණතාවය පහත වගුවේ යමකට හෝ ගැලපීම අවශ්‍ය වේ.

| | |
|---|---|
| 1 | ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (JLPT) N5 හෝ ඊට වැඩි මට්ටමක් සමත් අය |
| 2 | BJT ව්‍යාපාර ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය/ JLRT සවන්දීමේ අවබෝධතා පරීක්ෂණය (ලිවීමේ පරීක්ෂණය) සඳහා ලකුණු 300 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ඇති අය |
| 3 | J.TEST ප්‍රායෝගික ජපන් භාෂා පරීක්ෂණයේ F ශ්‍රේණිය හෝ ඊට ඉහළ සහතිකයක්, හෝ FG මට්ටමේ පරීක්ෂණය සඳහා ලකුණු 250 හෝ ඊට වැඩිය ගත් අය |
| 4 | ජපන් භාෂා NAT-TEST 5 වන ශ්‍රේණිය (පෙර 4 වන ශ්‍රේණිය) හෝ ඊට වැඩි සහතිකයක් ඇති අය |
| 5 | ව්‍යවහාරික ජපන් භාෂා අධ්‍යාපන සංගමය STBJ සම්මත ව්‍යාපාර ජපන් භාෂා පරීක්ෂණය සඳහා ලකුණු 350 හෝ ඊට වඩා ලබා ගත් අය |
| 6 | TOPJ ප්‍රායෝගික ජපන් භාෂා මෙහෙයුම් නිපුනතා පරීක්ෂණය ආරම්භක A හෝ ඊට වැඩි සහතිකයක් ලබා ගත් අය |
| 7 | J-cert ජපන් ජීවන රටා සහ වෘත්තීය නිපුනතා ජපන් භාෂා පරීක්ෂණයේ ආරම්භක ශ්‍රේණිය හෝ ඊට වැඩි සහතිකයක් ලබා ගත් අය |
| 8 | JLCT විදේශිකයන් සඳහා ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය JCT5 හෝ ඊට වැඩි සහතිකයක් ලබා ගත් අය |
| 9 | ප්‍රායෝගික ජපන් භාෂා සන්නිවේදන පරීක්ෂණය/ බ්‍රිජ් (PJC Bridge) C- හෝ ඊට වැඩි සහතිකයක් ලබා ගත් අය |
| 10 | JPT ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් ලකුණු 315ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ඇති අය |

## 02 ▸ පශ්චාත් උපාධි ආයතනයකට ඇතුළත් වන්නේ කෙසේද?

ජපානයේ පශ්චාත් උපාධි ආයතන වල, ශාස්ත්‍රපති උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා ඇති අතර වෘත්තීය පශ්චාත් උපාධි ආයතන වල වෘත්තීය උපාධි පාඨමාලා ඇත. ශාස්ත්‍රපති පාඨමාලා සඳහා ඇතුළත් වීමේ කොන්දේසි වන්නේ විශ්වවිද්‍යාලයකින් මූලික උපාධියක් ලබා ඇති අය, හෝ ඊට සමාන හෝ වැඩි අධ්‍යාපන සුදුසුකම් ඇති බවට සහතික ලත් අය හෝ විදේශ රටක වසර 16ක පාසල් අධ්‍යාපනයක් සම්පූර්ණ කළ අය වේ. තවද, ජපානයේ වසර 4ක වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවක් (වෘත්තීය අධ්‍යාපන ආයතනයක) සම්පූර්ණ කර උපාධිය ලබා "උසස් වෘත්තීය ඩිප්ලෝමා" යන තත්ත්වය ලබා ගත් අය පශ්චාත් උපාධි ආයතනයට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. ආචාර්ය උපාධි පාඨමාලාවට ඇතුළත් වීමේ කොන්දේසි වන්නේ ශාස්ත්‍රපති උපාධියක් ඇති අය හෝ, පෞද්ගලික ප්‍රවේශ සුදුසුකම් පරීක්ෂණයක් මගින්, මීට සමාන හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් ඇති බවට සහතික ලත් වයස අවුරුදු 22 ට වැඩි අය හෝ, විදේශ රටක ශාස්ත්‍රපති උපාධියට සමාන උපාධියක් ලබා ඇති අය වේ.

ප්‍රවේශ පරීක්ෂණයන්ට ජපානයේදී පෙනී සිටිය යුතුය (ලියකියවිලි පරීක්ෂාවෙන් පමණක් තෝරා ගන්නා පශ්චාත් උපාධි ආයතන ද ඇත). පරීක්ෂණ විෂයයන් අතරට ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව (හෝ වෙනත් විදේශීය භාෂා), ලිඛිත තාක්ෂණ විෂය පරීක්ෂණ, රචනා සහ පාඨමාලා විෂයයන් වල වාචික පරීක්ෂණ ආදිය ඇතුළත් වේ.

## 03 ▸ විශ්වවිද්‍යාලයකට ඇතුළත් වන්නේ කෙසේද?

විශ්වවිද්‍යාලයකට හෝ වෘත්තීය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට, වසර 12 ක පාසල් අධ්‍යාපනයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අවුරුදු 12 ට අඩු නම්, නම් කරන ලද පෙර සූදානම් අධ්‍යාපන පාඨමාලාවක් හෝ පුහුණු මධ්‍යස්ථානයක පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය, ඒ ඒ අධ්‍යාපන ආයතනය මගින් පවත්වන ප්‍රවේශ පරීක්ෂණයෙන්, අවුරුදු 12 ක පාඨමාලාව සම්පූර්ණ කිරීමට සමාන අධ්‍යාපන සුදුසුකම් ඇති බවට සහතික ලත් වයස අවුරුදු 18 ට වැඩි අය, හෝ අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් නම් කර ඇති විදේශ රටක "වසර 11ක් හෝ ඊට වැඩි පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය" ද උසස්පෙළ සමත් හා සමාන හෝ ඊට වැඩි ලෙස සලකා ඇතුළත් කර ගනු ලැබේ. ජපානයේ විශ්වවිද්‍යාල වල වෙන් වෙන් වශයෙන් ප්‍රවේශ පරීක්ෂණ පැවැත්වේ. විදේශීය ශිෂ්‍යයන් සඳහා වෙනම ප්‍රවේශ පරීක්ෂණ පවත්වන විශ්වවිද්‍යාලද ඇත.

තවද, ප්‍රවේශ පරීක්ෂණය වෙනුවට ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගය ආදේශ කරන විශ්වවිද්‍යාලද ඇත.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාලය වසර 4 ක් (වෛද්‍ය විද්‍යාල යනාදිය සඳහා වසර 6 ක්) වන අතර පාඨමාලාව සම්පූර්ණ කළ පසු "උපාධිය" ලැබේ.

## 04 ▸ කෙටි කාලීන විශ්වවිද්‍යාලයකට ඇතුළත් වන්නේ කෙසේද?

කෙටි කාලීන විශ්වවිද්‍යාලයකට /වෘත්තීය කෙටි කාලීන විශ්වවිද්‍යාලයකට ඇතුළත් කර ගන්නේ ද විශ්වවිද්‍යාලවල සේම, වසර 12ක පාසල් අධ්‍යාපනයක් සම්පූර්ණ කර ඇති අයයි. අවුරුදු 12 ට වඩා අඩු නම්, නම් කරන ලද පෙර සූදානම් අධ්‍යාපන පාඨමාලාවක් හෝ පුහුණු මධ්‍යස්ථානයක පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය, ඒ ඒ අධ්‍යාපන ආයතනය මගින් පවත්වන ප්‍රවේශ පරීක්ෂණයෙන්, අවුරුදු 12 ක පාඨමාලාව සම්පූර්ණ කිරීමට සමාන අධ්‍යාපන සුදුසුකම් ඇති බවට සහතික ලත් වයස අවුරුදු 18 ට වැඩි අය, හෝ අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් නම් කර ඇති විදේශ රටක "වසර 11ක් හෝ ඊට වැඩි පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය" ද උසස්පෙළ සමත් හා සමාන හෝ ඊට වැඩි ලෙස සලකා ඇතුළත් කර ගනු ලැබේ. ප්‍රවේශ පරීක්ෂණය ද විශ්වවිද්‍යාල හා සමාන වේ.

කෙටි කාලීන විශ්වවිද්‍යාලයක අධ්‍යයන කාලය වසර 2ක් (ඇතැම් පීඨ සඳහා වසර 3ක්) වන අතර පාඨමාලාව සම්පූර්ණ කළ පසු "කෙටි කාලීන විශ්වවිද්‍යාල උපාධිය" ප්‍රදානය කෙරේ.

## 05 ▸ තාක්ෂණ අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වන්නේ කෙසේද?

ඇතුළත් වීමේ කොන්දේසි, විශ්වවිද්‍යාල සහ කෙටි කාලීන විශ්වවිද්‍යාල හා සමාන වේ. නමුත්, පෞද්ගලික වියදමෙන් ඉගෙනගන්නා විදේශීය ශිෂ්‍යයන් භාර ගන්නේ කුඩා සංඛ්‍යාවකිනි.

තාක්ෂණ අධ්‍යාපන ආයතන වල අධ්‍යයන කාලය වසර 5ක් (ද්විතීය පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළ අය සඳහා) වන නමුත්, ජපන් පාසල් අධ්‍යාපන ක්‍රමයේ අවුරුදු 11 (උසස් පෙළ පාසලේ දෙවන ශ්‍රේණිය) සම්පූර්ණ කළ අය තාක්ෂණ අධ්‍යාපන ආයතන වල 3 වන ශ්‍රේණියට කෙලින්ම ඇතුලත් කරගනු ලැබේ. පාඨමාලාව සම්පූර්ණ කළ පසු, "ඩිප්ලෝමා උපාධිය" පිරිනමනු ලැබේ.

## 06 ▸ වෘත්තීය පුහුණු ආයතනයක වෘත්තීය පාඨමාලාවකට (වෘත්තීය අධ්‍යාපන ආයතනයකට) ඇතුළත් වන්නේ කෙසේද?

එය ජපානයේ සාමාන්‍යයෙන් වෘත්තීය අධ්‍යාපන ආයතනයක් ලෙස හඳුන්වන අධ්‍යාපන ආයතනයකි. අධ්‍යයන කාලය වසර 1ක සිට 4 දක්වා පාඨමාලාව අනුව වෙනස් වේ. නමුත් වසර 2ක පාඨමාලා වඩාත් බහුල වේ. සාමාන්‍යයෙන්, අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද වසර 2ක හෝ 3ක පාඨමාලාවක් සම්පූර්ණ කළ පසු “වෘත්තීය ඩිප්ලෝමා” ප්‍රදානය කෙරේ. වසර 4 ක පාඨමාලාවක් සම්පූර්ණ කළ විට “උසස් වෘත්තීය ඩිප්ලෝමා” පිරිනමනු ලැබේ. වෘත්තීය අධ්‍යාපන ආයතනවල අරමුණ වන්නේ වෘත්තීමය සහ එදිනෙදා ජීවිතයට අවශ්‍ය තාක්ෂණය සහ දැනුම ලබා ගැනීමයි.

කර්මාන්තය, කෘෂිකර්මය, වෛද්‍ය රැකවරණය, සනීපාරක්ෂාව, අධ්‍යාපන/ සමාජ සුබසාධනය, ප්‍රයෝගික ව්‍යාපාර, විලාසිතා/ ගෘහ ආර්ථික විද්‍යාව, සංස්කෘතිය/ අධ්‍යාපනය ලෙස ක්ෂේත්‍ර 8ක් ඇත.

වෘත්තීය අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට සුදුසුකම වන්නේ වසර 12 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීමයි. අවුරුදු 12 ට වඩා අඩු නම්, නම් කරන ලද පෙර සූදානම් අධ්‍යාපන පාඨමාලාවක් හෝ පුහුණු මධ්‍යස්ථානයක පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය, ඒ ඒ අධ්‍යාපන ආයතනය මගින් පවත්වන ප්‍රවේශ පරීක්ෂණයෙන්, අවුරුදු 12 ක පාඨමාලාව සම්පූර්ණ කිරීමට සමාන අධ්‍යාපන සුදුසුකම් ඇති බවට සහතික ලත් වයස අවුරුදු 18 ට වැඩි අය, හෝ අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් නම් කර ඇති විදේශ රටක “වසර 11ක් හෝ ඊට වැඩි පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති අය” ද උසස්පෙළ සමත් හා සමාන හෝ ඊට වැඩි ලෙස සලකා ඇතුළත් කර ගනු ලැබේ. වෘත්තීය අධ්‍යාපන ආයතනයක ප්‍රවේශ පරීක්ෂණය සඳහා, ලේඛන පරීක්ෂාවට අමතරව, ජපන් භාෂා පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ ආදිය ඇතුළත් වේ.

තවද, වෘත්තීය අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීම සඳහා, ඉහත සඳහන් කරුණු වලට අමතරව ජපන් භාෂා ප්‍රවීණතාවයක් ලෙස පහත වගුවේ ඇති කොන්දේසි වලින් එකක් සපුරාලිය යුතුය.

| | |
|---|---|
| 1 | ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණයේ N1 හෝ N2 සමත් අය |
| 2 | ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගයේ ජපන් භාෂා විෂයයන් සඳහා එකතුව ලකුණු 200 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති අය |
| 3 | ජපාන කන්ජි යෝග්‍යතා පරීක්ෂණ සංගමය විසින් පවත්වනු ලබන BJT ව්‍යාපාර ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය/ JLRT සවන්දීමේ කියවීමේ අවබෝධතා පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) සඳහා ලකුණු 400 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ඇති අය |
| 4 | අධිකරණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කර ඇති ජපන් භාෂා අධ්‍යයන ආයතනයකින් මාස 6ක් හෝ ඊට වැඩි කාලයක් ජපන් භාෂා අධ්‍යාපනය ලබා ඇති, සහ ඇතුළත් වන අධ්‍යාපන ආයතනයේ ජපන් භාෂා පරීක්ෂණයකින් ජපන් භාෂා ප්‍රවීණතාවය N2 මට්ටමට (2 වන මට්ටම) සමාන හෝ ඊට වැඩි බවට තහවුරු වූ අය |
| 5 | ජපානයේ ප්‍රාථමික, ද්විතීය හෝ උසස්පෙළ පාසලක වසරකට හෝ ඊට වැඩි කාලයක් අධ්‍යාපනය ලබා ඇති, සහ ඇතුළත් වන අධ්‍යාපන ආයතනයේ ජපන් භාෂා පරීක්ෂණයකින් ජපන් භාෂා ප්‍රවීණතාවය N2 මට්ටමට (2 වන මට්ටම) සමාන හෝ ඊට වැඩි බවට තහවුරු වූ අය |

## 07 ▸ ශිෂ්‍යත්ව ක්‍රමවේද තිබේද?

ජපන් ශිෂ්‍ය උපකාරක සංවිධානය (JASSO) මගින්, පරීක්ෂණ හරහා තෝරා ගන්නා ලද, අධ්‍යාපන සුදුසුකම් හා පෞරුෂය යන දෙඅංශයෙන්ම විශිෂ්ට වන, ජපානයේ අධ්‍යයනය කිරීමට අදාළ වාර්තා (පෞද්ගලික අත්දැකීම්) සපයන සහ මූල්‍යමය තත්ත්වය ආදී කරුණු සපුරාලන විදේශීය ශිෂ්‍යයන් සඳහා, “විදේශීය ශිෂ්‍යයන් පිළිගැනීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විදේශීය ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන දිරි දීමනා)” නමින් ශිෂ්‍යත්ව ක්‍රමවේදයක් පවත්වාගෙන යනු ලැබේ.

මීට අමතරව, ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගයට මුහුණ දී, විශේෂයෙන්ම විශිෂ්ට ප්‍රතිඵල ලබා, ජපානයට පැමිණීමට පෙර, විශ්වවිද්‍යාල ආදියෙන් ජපානයේ අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමේ අවසරය ලැබූ අය සඳහා, මෙම ක්‍රමවේදයේ ප්‍රතිලාභ ලබාදීමේ අවස්ථාවන් කලින් වෙන් කරවා ගැනීමේ ක්‍රමවේදයක් ඇත. මීට අමතරව, ඇතැම් පළාත් පාලන සහ පෞද්ගලික ආයතන මගින්ද, විදේශීය ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යත්ව ක්‍රමවේද පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, සියලුම විදේශීය ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබා ගැනීමට අවස්ථාව නැත. එමනිසා, ජපානයේ අධ්‍යාපනයට පැමිණීමට පෙර ශක්තිමත් මූල්‍ය සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ.

## 08 ▸ ජපානයේ රැකියාවක් ලබා ගත හැකිද?

අධ්‍යාපනය සම්පූර්ණ කළ පසු ජපානයේදී ඉගෙන ගත් තාක්ෂණික දැනුම සහ කුසලතා උපයෝගී කර ගැනීමෙන් ජපන් සමාගමක රැකියාවක් ලබා ගත හැකිය. නමුත්, ජපානයේ, සියලුම වෘත්තීන්වල විදේශිකයන් හට රැකියාව කිරීමට අවසර ලැබේ යයි කිව නොහැක. ජපානයේදී ඉගෙනුම ලබන පාඨමාලාව අනුව ලබා ගත හැකි රැකියා පිළිබඳව කල්තියා සොයා බැලීම අවශ්‍ය වේ. තවද, රැකියා සෙවීමේදී, රැකියාව ලබා ගත් පසු කිරීමට බලාපොරොත්තු වන දේ පිළිබඳව හැකිතාක් නිශ්චිත ඉලක්ක තිබීම වැදගත් වේ. ජපන් සමාගම්, විදේශීය ශිෂ්‍යයන්ගෙන් “උසස් ජපන් භාෂා ප්‍රවීණතාවයක්”, “ජපන් සංස්කෘතියට අනුවර්තනය වීමේ හැකියාව” සහ “විශ්වවිද්‍යාල සහ වෘත්තීය අධ්‍යාපන ආයතන වලින් ලබා ගත් තාක්ෂණික දැනුම සහ කුසලතා” බලාපොරොත්තු වේ. ජපානයේ රැකියාවක් කිරීමේදී, ප්‍රදේශයේ ආගමන විගමන කාර්යාංශයේදී ඔබගේ නේවාසික පදිංචි සුදුසුකම “විදේශීය ශිෂ්‍ය” යන්නෙන්, රැකියා කිරීමට අවසර සලසන වෙනත් නේවාසික පදිංචි සුදුසුකමකට වෙනස් කිරීමේ ක්‍රියාපටිපාටිය සිදු කළ යුතුය.

රැකියා කළ හැකි නේවාසික පදිංචි සුදුසුකම් අතර, ඉහල තාක්‍ෂණ කුසලතා/ දැනුම, හෝ විදේශීය සංස්කෘතිය පදනම් කරගත් චින්තන ආදිය අවශ්‍ය වන කාර්යයන්හි නිරත වන “තාක්ෂණ / මානව ශාස්ත්‍ර දැනුම/ ජාත්‍යන්තර රාජකාරි” ප්‍රධාන වේ. ඊට අමතරව “පරිපාලන/ කළමනාකරණ”, “අධ්‍යාපන”, “හෙද” සහ නිශ්චිත කාර්මික ක්ෂේත්‍රයක සැලකිය යුතු දැනුමක්/ කුසලතා හෝ පළපුරුද්දක් අවශ්‍ය වන කාර්යයන්හි නිරත වන “විශේෂිත කුසලතා” යනාදිය ද ඇත.

තවද, අධ්‍යාපනය සම්පූර්ණ වන විටත් රැකියාවක් තීරණය වී නැති අවස්ථාවක වුවද, විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන සහ වෘත්තීය අධ්‍යාපන ආයතන වෙතින් උපාධි ලබා ගන්නන් (“වෘත්තීය ඩිප්ලෝමා” / “උසස් වෘත්තීය ඩිප්ලෝමා” යන තත්වයන් ලබා ඇති අය), “විදේශීය ශිෂ්‍ය” සිට “විශේෂිත ක්‍රියාකාරකම් (අඛණ්ඩව රැකියා සෙවීම)” යන නේවාසික පදිංචි සුදුසුකම වෙත මාරු කිරීම මගින්, අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් පසු උපරිම වසරක් ( මාස 6ක් + නැවත මාස 6කට අළුත්කිරීම) දක්වා රැකියා සෙවීම කරගෙන යා හැක. ඉන්පසුව, තවදුරටත් රැකියා සොයන උපාධිධාරී විදේශීය ශිෂ්‍යයන් හට, පළාත් පාලන ආයතන විසින් පවත්වනු ලබන රැකියා සෙවීමේ ආධාරක ව්‍යාපෘතිවලට සහභාගී වීමේ කොන්දේසිය මත තවත් වසරක් (මාස 6ක් + නැවත මාස 6කට අළුත්කිරීම) (උපාධියෙන් පසු 2 වන වසර) වන තෙක් ජපානයේ රැඳී සිටීමට අවසර ලැබේ.

# III. ජපානයේ ජීවත් වීම ගැටලුවක් නොවන්නේද?

## 01 ▸ නේවාසික පදිංචි කාඩ්පත යනු කුමක්ද?

“නේවාසික පදිංචි කාඩ්පත” යනු ජපානයේ මධ්‍යම හෝ දිගු කාලීනව (මාස 3කට වැඩි) රැඳී සිටින විදේශිකයන් සඳහා වන ගොඩබැසීමේ අවසරය, නේවාසික පදිංචි සුදුසුකම වෙනස් කිරීමේ අවසරය හෝ නේවාසික පදිංචි කාලය වෙනස් කිරීමේ අවසරය ආදී පදිංචිය සම්බන්ධ බලපත්‍ර වෙනුවට භාවිතා කල හැකි දෙයකි (ඡායාරූපය බලන්න). ජපානයේ නේවාසික පදිංචි කාලය මාස 3ක් හෝ ඊට අඩු අය සහ ඇතැම් නේවාසික පදිංචි සුදුසුකම් ඇති අය සඳහා අදාල නොවේ. සෑම විටම මෙම නේවාසික පදිංචි කාඩ්පත රැගෙන යා යුතුය.

“නේවාසික පදිංචි කාඩ්පතෙහි” වලංගු කාලය, වයස අවුරුදු 16 හෝ ඊට වැඩි විදේශීය ශිෂ්‍යයන් සඳහා, නේවාසික පදිංචි කාලය අවසන් වන තෙක් වේ. නේවාසික පදිංචි කාලය අලුත් කල විට හෝ නේවාසික පදිංචි සුදුසුකම වෙනස් කළ විට, නව නේවාසික පදිංචි කාඩ්පතක් නිකුත් කරනු ලැබේ.

“නේවාසික පදිංචි කාඩ්පත” ජපානයට ප්‍රථම වරට ඇතුළු වන විට ඇතැම් ගුවන්තොටුපළවල් (නරිතා ගුවන්තොටුපළ, හනෙදා ගුවන්තොටුපළ, චූබු ගුවන්තොටුපළ, කන්සයි ගුවන්තොටුපළ, නව චිතොසෙ ගුවන්තොටුපළ, හිරොශිමා ගුවන්තොටුපළ සහ ෆුකුඔකා ගුවන්තොටුපළ. 2022 අප්‍රේල් වන විට) හිදී ගොඩබැසීමේ ක්‍රියාපටිපාටිය තුලම නිකුත් කරනු ලැබේ. අනෙක් ගුවන්තොටුපළවලින් ඇතුළුවීමේදී, විදේශ ගමන් බලපත්‍රයේ ගොඩබැසීමේ අවසර මුද්‍රාව සමඟම, “පසු දිනකදී නේවාසික පදිංචි කාඩ්පත නිකුත් කෙරේ” යනුවෙන් සටහන් කෙරේ. මධ්‍යම හා දීර්ඝ පදිංචිකරුවන් තම පදිංචි ප්‍රදේශයේ නගර සභාවේ දී පදිංචිය දැනුම් දීමෙන් පසු නේවාසික පදිංචි කාඩ්පත නිකුත් කරනු ලැබේ. (සාමාන්‍යයෙන්, ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාලය විසින් දැනුම් දෙන ලද පදිංචි ස්ථානයට තැපැල් කරනු ලැබේ).

ජපානයට ඇතුළු වන විට ගුවන්තොටුපළේදී “නේවාසික පදිංචි කාඩ්පත” නිකුත් කෙරුණු අය තම පදිංචි ස්ථානය තීරණය කර දින 14 ක් ඇතුළත, නේවාසික පදිංචි කාඩ්පත රැගෙන ගොස්, ප්‍රදේශයේ නගර සභා කවුන්ටරයේ දී, තම පදිංචි ස්ථානය පිළිබඳව ජපානයේ ආගමන විගමන කාර්යාංශයේ කොමසාරිස්ට දැනුම් දෙන්න.

නේවාසික පදිංචි කාඩ්පත් පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර පහත ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවිය වෙත යොමු වන්න.


http://www.moj.go.jp/isa/publications/materials/newimmiact_4_point.html

### නේවාසික පදිංචි කළමනාකරණ ක්‍රමවේදයේ අනුපිළිවෙල

**ඇතුල්වීමේ සහ පිටවීමේ තොටුපල**

**ආගමන පරීක්ෂණය**

**විදේශ ගමන් බලපත්‍රයේ ගොඩබැසිමේ අවසර මුද්‍රාව තබා, එම අවසරයට අනුව මධ්‍යම හා දීර්ඝ කාලීන පදිංචිකරුවන් සඳහා නේවාසික පදිංචි කාඩ්පතක් නිකුත් කෙරේ.**
(සැ.යු.) “නේවාසික පදිංචි කාඩ්පත” නිකුත් කරනු ලබන්නේ, 2022 අප්‍රේල් වන විට, නරිතා ගුවන්තොටුපළ, හනෙදා ගුවන්තොටුපළ, චූබු ගුවන්තොටුපළ, කන්සයි ගුවන්තොටුපළ, නව චිතොසෙ ගුවන්තොටුපළ, හිරොශිමා ගුවන්තොටුපළ සහ ෆුකුඔකා ගුවන්තොටුපළ දීය.




**නගර සභාවේදී**

**පදිංචිය (වෙනස් කිරීම) පිළිබඳ දැනුම්දීම**

**ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයේදී**

**පදිංචිය හැර වෙනත් (වෙනස් කිරීම්) දැනුම්දීම**

| | |
|---|---|
| නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, පුරවැසිභාවය/ කලාපය වෙනස් කිරීම පිළිබඳ දැනුම්දීම | |
| නේවාසික පදිංචි වලංගු කාල සීමාව අලුත් කිරීම සඳහා ඉල්ලුම්කිරීම | ස්ථිර පදිංචි අය / උසස් වෘත්තීය අංක 2 / වයස අවුරුදු 16 ට අඩු අය |
| නේවාසික පදිංචි කාඩ්පත නැවත සාදා ගැනීම | නේවාසික පදිංචි කාඩ්පත නැතිවීම, සොරකම් කිරීම, විනාශ වීම, විශාල ලෙස හානි වීම හෝ අපිරිසිදු වීම යනාදිය සිදුවූ විට |
| අනුබද්ධ ආයතනය / කලත්‍රයා සම්බන්ධ දැනුම්දීම* | රැකියා සුදුසුකම, “විදේශීය ශිෂ්‍ය” ආදී අධ්‍යයන සුදුසුකම් සහ කලත්‍රයෙකු ලෙස සුදුසුකම් ඇති නේවාසික පදිංචිකරුවන් |

* අනුබද්ධ ආයතනය / කලත්‍රයා පිළිබඳ දැනුම්දීම් අන්තර්ජාලය භාවිතයෙන් සිදු කළ හැක.
[ජපානයේ ආගමන විගමන කාර්යාංශයේ ඉලෙක්ට්‍රොනික දැනුම්දීම් පද්ධතිය]
https://www.moj.go.jp/isa/publications/materials/i-ens_system.html

**නේවාසික පදිංචි පරීක්ෂණය**

මධ්‍යම හා දීර්ඝ කාලීන පදිංචිකරුවන්ගේ නේවාසික පදිංචි කාලය අලුත් කල විට හෝ නේවාසික පදිංචි සුදුසුකම වෙනස් කළ විට, නව නේවාසික පදිංචි කාඩ්පතක් නිකුත් කරනු ලැබේ.

(ජපානයේ ආගමන විගමන කාර්යාංශය විසින් සැකසූ “ආගමන විගමන නේවාසික පදිංචි කළමනාකරණය 2021 සංස්කරණය” වෙතින් උපුටා ගන්නා ලදී)

## 02 ජපානයේ ජීවත් වීමට කොපමණ මුදලක් වැය වේද?

ජපානයේ ජීවන වියදම ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. මෙහිදී, දර්ශකයක් ලෙස කන්තෝ ප්‍රදේශයේ (ඉබරකි, තොචිගි, ගුන්මා, සයිතමා, චිබා, ටෝකියෝ, කනගවා) පිළිබඳ උදාහරණ හඳුනා ගනිමු. පහත තොරතුරු අනුව, ජපානයේ ජීවන වියදම ගණනය කර බලන්න.

### ◆ ජීවන වියදම

පහතින් දැක්වෙන්නේ කන්තෝ ප්‍රදේශයේ පදිංචි විදේශීය ශිෂ්‍යයන් හට, අධ්‍යාපන ගාස්තු වලට අමතරව අවශ්‍ය වන අනෙකුත් ප්‍රධාන වියදම් අයිතම සහ සාමාන්‍ය මාසික වියදම වේ.

| වියදම් අයිතමය | ආහාර | නිවාස/ උපයෝගිතා වියදම් | රක්ෂණ/ වෛද්‍ය වියදම් | විනෝදාංශ/ විනෝදාස්වාද වියදම් | ප්‍රවාහන වියදම් | අනෙකුත් දෛනික වියදම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය මාසික ගාස්තුව | යෙන් 30,000 | යෙන් 57,000 | යෙන් 3,000 | යෙන් 6,000 | යෙන් 5,000 | යෙන් 8,000 | යෙන් 109,000 |

(මූලාශ්‍රය: ජපන් ශිෂ්‍ය උපකාරක සංවිධානය "2021 ජනවාරි මස, පෞද්ගලික වියදමෙන් ඉගෙනගන්නා විදේශීය ශිෂ්‍යයන්ගේ ජීවන තත්ත්වයන් පිළිබඳ සමීක්ෂණ ප්‍රතිඵල: පදිංචි තත්වය අනුව අයිතමය අනුව වියදම් විස්තර (ටෝකියෝ)" ඇසුරිනි)

මෙයට සාමාන්‍ය අධ්‍යයන සහ පර්යේෂණ වියදම් (යෙන් 62,000) එකතු කළ විට, සාමාන්‍ය මාසික ජීවන වියදම යෙන් 171,000 ක් වේ.

### ◆ නිවාස වියදම්

ඉහත සඳහන් වියදම් අතර, "නිවාස/ උපයෝගිතා වියදම" හි විශේෂයෙන් නිවාස කුලිය, ජීවත් වන ප්‍රදේශය අනුව වෙළඳපල මිල වෙනස් වේ. පුද්ගලික බදු නිවාස, විදේශීය ශිෂ්‍යයන් සඳහා වන නේවාසිකාගාර, සාමාන්‍ය ශිෂ්‍ය නේවාසිකාගාර සහ අනෙකුත් සියල්ල ඇතුලත් නිවාස කුලියේ සාමාන්‍ය ගත් විට, කන්තෝ ප්‍රදේශයේ සාමාන්‍ය මාසික ගාස්තුව යෙන් 41,000 ක් වන අතර එය මුළු රටේම ඉහළම අගය වේ.

පුද්ගලික කුලී නිවාස ආදිය කුලියට ගැනීමේදී, නිවාස කුලිය වැඩි මිලක් ගන්නා අතර, ඇපකරුවෙකු අවශ්‍ය විය හැකිය. තවද, ඇතුළුවන අවස්ථාවේ මාසික කුලියට අමතරව, ආරක්ෂක තැන්පතු, තෑගි මුදල් සහ රක්ෂණ තැන්පතු ආදී මාසික කුලියේ කිහිප ගුණයක මුදලක් අවශ්‍ය වේ. කල්බදු ගිවිසුමකදී, ගිවිසුම් කාලය නියම කර ඇති අතර, එය අලුත් කිරීමේදී අලුත් කිරීමේ ගාස්තු ආදී වියදම් ගෙවීමට සිදු විය හැකිය.

අධ්‍යාපන ආයතනය "විදේශීය ශිෂ්‍ය නිවාස සඳහා වන්දි" ක්‍රමයට දායක වූ ආයතනයක් නම්, විදේශ ශිෂ්‍යයා රක්ෂණයකට ඇතුළු වීමේ කොන්දේසිය මත, ආයතනය විසින්ම ඇපකරුවෙකු බවට පත්වන ක්‍රමවේදයක් ඇත. කරුණාකර අධ්‍යාපන ආයතනයෙන් විමසන්න.

මෑතකදී, පෞද්ගලික දේපල වෙළඳාම් සමාගම් විසින්, විදේශිකයන් භාර ගන්නා නිවාස සහ ඇපකරුවෙකු අවශ්‍ය නොවන නිවාස හඳුන්වා දීම වැඩි වෙමින් පවතී. එබැවින් අන්තර්ජාලය හෝ විදේශීය ශිෂ්‍යයන් සඳහා වන තොරතුරු සඟරා පරීක්ෂා කර බලන්න.

### ◆ එදිනෙදා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආදියෙහි මිල

ජපානය තුල වුවද ප්‍රදේශය අනුව වෙනස් වේ. උදාහරණයක් ලෙස ටෝකියෝ නගරයේ දත්ත සලකා බලමු. (මූලාශ්‍රය: "ටෝකියෝ හි සංඛ්‍යාලේඛන" 2022 ජනවාරි)


(බදු ඇතුළුව)

| අයිතමය | ජල ගාස්තුව මාසික (20m$^2$) | විදුලි බිල මාසික | සහල් (සහල් "කොෂිහිකාරි" හැර) 5Kg | පාන් 1kg | පිසින තෙල් බෝතලයක් 1,000g | පාන් පිටි 1kg | බිත්තර පැකට්ටුවක් කෑලි 10 |
|---|---|---|---|---|---|---|---|
| මිල | යෙන් 2,475 | යෙන් 16,620 | යෙන් 2,165 | යෙන් 506 | යෙන් 504 | යෙන් 323 | යෙන් 246 |
| බත් පැකට් (බැදපු චිකන් බත්) 1ක් | රෙදි සෝදන සබන් කුඩු 1kg | ටොයිලට් පේපර් (මීටර් 1,000) | සෙම්ප්‍රතිශ්‍යා ඖෂධ (සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යා ඖෂධ) පැකට් 44ක පෙට්ටියක් | සෙම්ප්‍රතිශ්‍යා ඖෂධ (උන හා වේදනා නාශක) පෙති 40ක පෙට්ටියක් | බස් ගාස්තුව (සාමාන්‍ය බස්රථ) 7km (1වරක්) | ගේම් සොෆ්ට්වෙයාර් 1ක් | කැරෝකී කාමරය භාවිත ගාස්තු 1 පුද්ගලයෙකුට |
| යෙන් 487 | යෙන් 385 | යෙන් 685 | යෙන් 1,667 | යෙන් 674 | යෙන් 217 | යෙන් 6,266 | යෙන් 978 |

## 03 ▶ විදේශීය ශිෂ්‍යයන්ට අර්ධකාලීනව රැකියා කළ හැකිද?

"ජපානය යනු විදේශීය ශිෂ්‍යයන්ට අර්ධකාලීන රැකියා වල යෙදිය හැකි බැවින්, ඒවායේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු කළ හැකි රටක්" යැයි බොහෝ දෙනා සිතන නමුත්, එය නිවැරදි නොවේ. ජපන් රජය, විදේශීය ශිෂ්‍යයන් සඳහා "විදේශීය ශිෂ්‍ය" නේවාසික පදිංචි සුදුසුකම ලබා දෙන නමුත් ඒ යටතේ සිදු කළ හැකි ක්‍රියාකාරකම් යටතට අර්ධකාලීන රැකියා ආදිය ඇතුළත් නොවේ. එමනිසා, අධ්‍යයන කටයුතුවලට බාධාවක් නොවන මට්ටමින් අර්ධකාලීනව රැකියාවක් කිරීමට අවශ්‍ය නම්, ජපානයේ ආගමන විගමන කාර්යාංශයෙන් "නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය" ලබා ගත යුතුය.

(නේවාසික පදිංචි කාඩ්පතේ පිටුපස)




නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය ලැබුණු විට ඒ තොරතුරු සටහන් කෙරෙන තීරුව මෙයයි.

නමුත්, විදේශීය ශිෂ්‍යයන් "නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය" ලබා ගත්තද, සිදුකල හැකි රැකියා සහ ස්ථාන පිළිබඳ සීමාවන් පවතින අතර, අර්ධකාලීන රැකියා කළ හැකි කාලය සතියකට පැය 28 දක්වා (දිගු නිවාඩු කාල තුළ දිනකට පැය 8ක් දක්වා) වේ.

* අර්ධකාලීන රැකියා සඳහා පැයක වැටුප, ප්‍රදේශය සහ රැකියාව අනුව වෙනස් වේ. 2021 දී ටෝකියෝවේ අවම වැටුප යෙන් 1,041 කි. මෙය නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරයේ (අර්ධකාලීන රැකියා), අවසර දී ඇති උපරිම කාලසීමාව සඳහා ගණනය කල විට, අර්ධකාලීන රැකියාවක මාසික ආදායම යෙන් 1,041 x පැය 28 = යෙන් 29,148 (සති 1) x සති 4 (මාස 1)) = යෙන් 116,592කි. කෙසේ වෙතත්, ජපන් ශිෂ්‍ය උපකාරක සංවිධානයේ සමීක්ෂණයට අනුව (2020 පෙබරවාරි), ඉහත සඳහන් කළ අර්ධකාලීන රැකියා වලින් (රට පුරා) විදේශීය ශිෂ්‍යයන් ඇත්ත වශයෙන් උපයන සාමාන්‍ය මාසික වැටුප, උසස් අධ්‍යාපන ආයතනවල යෙන් 74,000 ක් සහ ජපන් භාෂා අධ්‍යයන ආයතනවල යෙන් 87,000 කි. අනුබද්ධ ආයතනය සහ විෂයමාලාව අනුව අර්ධකාලීන රැකියාවක් සඳහා වැය කළ හැකි කාලයෙහි වෙනසක් ඇති බව කිව හැකිය.

* අර්ධකාලීන රැකියා ආදායමෙන් පමණක් ශිෂ්‍යයන්ගේ ජීවන වියදම සම්පූර්ණයෙන් පියවා ගැනීම අපහසුය. නමුත් සමහර ශිෂ්‍යයන් "ජපානයට ගියොත් පාට් ටයිම් කරලා අධ්‍යාපන වියදම් සහ ජීවන වියදම් ඇති තරම් හොයාගන්න පුළුවන්" ආදී සැහැල්ලු කතා විශ්වාස කර ජපානයට පැමිණ, පසුකාලීනව ජපානයේ විදේශ ශිෂ්‍ය ජීවිතය පවත්වාගෙන යාමට නොහැකිව ආපසු තම රටට යාමට සිදුවන අවස්ථා ද ඇත. තවද, මෑතකදී, "පහසුවෙන් මුදල් උපයා ගත හැකි අර්ධකාලීන රැකියා" යන නමින්, වංචනික ක්‍රෙඩිට් කාඩ් තොරතුරු අවභාවිතා කරන අපරාධ සඳහා ජපානයට අලුතින් පැමිණි විදේශීය ශිෂ්‍යයන් සම්බන්ධ කර ගැනීමට, එම රටේම අය උත්සාහ කරන සිද්ධීන් මෑතකදී වැඩිවෙමින් පවතී. එබැවින් SNS සමාජ මාධ්‍ය භාවිතා කළ රැකියා සෙවීම් වලදී ප්‍රවේශම් විය යුතුය. ජපානයේ අධ්‍යාපනයට පැමිණෙන විට, අර්ධකාලීන රැකියා ආදායම මත අනවශ්‍ය ලෙස යැපෙන්නට නොසිතා, නිසියාකාර සැලැස්මක් සාදා ගනිමු.

| අර්ධකාලීන රැකියා සිදු කිරීමට තහනම් රැකියා ක්ෂේත්‍ර සහ ස්ථාන |
|---|
| **1. ලිංගික ව්‍යාපාර සහ ගණිකා වෘත්තීය සම්පූර්ණයෙන්ම තහනම්ය.**<br>කැබරේ, හොස්ටස් බාර්, රාත්‍රී සමාජ ශාලා, ඩාන්ස් හෝල්, අමුත්තන්ට කෑමබීම සංග්‍රහ කරන බාර්, පචින්කෝහල්, මාජාන් හල්, ගේම් යන්ත්‍ර ස්ථාපන ව්‍යාපාර, පෞද්ගලික කාමරය සහිත නාන ස්ථාන, ස්ට්‍රිපින්, පීප් රඟහල්, මෝටෙල්, ලව් හොටෙල්, ඇඩල්ට් ෂොප්, විනිල් හල්, පුද්ගලික කාමර සහිත සම්බාහනසැල්, නිවෙස් කරා යන ෆැෂන් හෙල්ත්, ඇඩල්ට් වීඩියෝ ඔන්ලයින් ෂොපින්, අන්තර්ජාලයේ අසභ්‍ය පින්තූර සපයන ව්‍යාපාර, ටෙලිෆෝන් ක්ලබ් ව්‍යාපාර, ෆෝන් ඩේටින්, මැසේජ් ඩයල් ව්‍යාපාර |
| **2. ස්නැක් බාර්, පබ්, කොෆී ෂොප්, අවන්හල් ආදිය තුල පහත දේ තහනම් කර ඇත:**<br>① ගනුදෙනුකරුවන්ට විනෝදාස්වාදය ලබා දීම සඳහා සත්කාරක සේවිකාවන් සිටින ස්ථාන<br>② ආලෝකය අඩු (ආලෝකය 10 lux හෝ ඊට අඩු) ස්ථාන<br>③ ඇහිරුණු (වර්ග මීටර් 5 ක් හෝ ඊට අඩු ආසන ඇති) අන් අයට දැකීමට අපහසු ස්ථාන |

* මෙවැනි ස්ථානවල අර්ධකාලීන රැකියාවක් නොකළ ද, එවැනි ව්‍යාපාර පිළිබඳ පත්‍රිකා වැනි ප්‍රචාරණ ද්‍රව්‍ය මග දෙපසදී බෙදා හැරීම සහ තහනම් ස්ථානවල (ඉහත 1 හෝ 2 ට අදාළ ස්ථාන) පිරිසිදු කිරීමේ අර්ධකාලීන රැකියාද එලෙසම තහනම් කර ඇත.


## 04 ▸ විදුලිය, ගෑස්, ජලය, දුරකථන යනාදිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටි කෙසේ සිදු කළ යුතුද?

ජපානයේ ජීවත් වීමට විදුලිය, ගෑස්, ජලය, දුරකථන ආදිය අවශ්‍ය වේ.

කුලී නිවසක් වැනි තනිව නවාතැනක් කුලියට ගන්නේ නම්, මේවා සඳහා ගිවිසුම්ද තනි තනිව සිදු කළ යුතුය. කුලී නිවාස ආදියෙහි කුලිය තුල එම වියදම් ඇතුළත් නොවන බැවින් ඒ සඳහා වෙනම ගෙවීමට සිදුවේ. ගාස්තුව ගෙවීමට අපොහොසත් වුවහොත්, සේවාව අත්හිටුවිය හැකි බැවින් සැලකිලිමත් වන්න.

ජපානයේ නළ ජලය කෙලින්ම පානය කළ හැකිය. විදේශ වල නිෂ්පාදිත විදුලි උපකරණ ජපන් ප්‍රමිතීන්ට අනුකූල නොවේ නම්, ඒවා භාවිතා කළ නොහැකි විය හැකි බැවින් සැලකිලිමත් වන්න.

## 05 ▸ කෙදිනක, කෙසේ කසළ බැහැර කරන්නේ ද? (කසළ සහ ප්‍රතිචක්‍රීකරණය)



ජපානයේ කසළ බැහැර කිරීමේ ක්‍රමය පදිංචි ප්‍රදේශය අනුව වෙනස් වේ. ඔබේ ප්‍රදේශයේ නීතිරීතිවලට අනුව නිසි ලෙස කසළ බැහැර නොකළහොත්, ප්‍රදේශවාසීන් සමඟ ආරවුල් ඇතිවීමට හේතු විය හැකිය. සෑම නිවසකම කසළ වෙන්කර (පිළිස්සිය හැකි කසළ, පිළිස්සිය නොහැකි කසළ ආදිය), ඒ ඒ කසළ එකතු කරන දිනයේ නියමිත වේලාවට නියමිත එකතු කිරීමේ ස්ථානයට (හෝ නම් කරන ලද ස්ථානයට) බැහැර කරන්න. විශාල කසළ බැහැර කිරීමට අවශ්‍ය නම්, පදිංචි ස්ථානයේ නගර සභාව විසින් නිශ්චිතව දක්වා ඇති බැහැර කිරීමේ ක්‍රමය අනුගමනය කරන්න.

## 06 ▸ හදිසි අවස්ථාවක දී කළ යුත්තේ කුමක්ද?

හදිසියේ හෝ ගින්නක් ඇති වුවහොත්, හදිසියේ රෝගාතුර වී හෝ තුවාල වී ගිලන් රථයක් ඇමතීමේදී, කිසියම් ආපදාවක් හෝ අනතුරක් සිදුවුවහොත්, කරුණාකර කලබල නොවී පහත වගුවේ ඇති දුරකථන අංකයන්ට දැනුම් දෙන්න. භූමිකම්පාවකදී, ගෘහ භාණ්ඩ පෙරළීම වැළැක්වීම, හදිසි අවශ්‍යතා මල්ලක් සූදානම් කර තැබීම, ආපදාවකදී රැස්වන ස්ථානය දැනුවත් වී සිටීම ආදී පෙර සූදානම් සිදු කරමු. එසේම භූමිකම්පාවක් ඇති වුවහොත් කලබල නොවී සන්සුන්ව හා කල්පනාවෙන් කටයුතු කිරීම වැදගත් වේ.

හදිසි අවස්ථාවකදී රැගෙන යාමට, උදාහරණයක් ලෙස, පහත දේ වහාම පිටතට ගැනීමට හැකි ලෙස සූදානම් කර තබන්න. ආහාර (ටින් කළ ආහාර, ටින් කටරය, රිටෝට් නිෂ්පාදන, රසකැවිලි), පානීය ජලය / ගිනිපෙට්ටි, ලයිටර/ ඖෂධ (සාමාන්‍ය ඖෂධ) / වටිනා භාණ්ඩ (බැංකු පොත, නිල මුද්‍රාව, මුදල්, සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත, නේවාසික පදිංචි කාඩ්පත, මයි නම්බර් කාඩ්පත, විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝර්ට් එක), ටෝච් එකක්, ගෙනයා හැකි ගුවන්විදුලියක්, බැටරි



| ඇමතුමට හේතුව | සම්බන්ධීකරණ තොරතුරු | දුරකථන අංකය |
|---|---|---|
| ගින්නකදී / බේරා ගැනීමකට/ හදිසි රෝගී, තුවාල වීමක් | ගිනි නිවන දෙපාර්තමේන්තුව | 119 (පැය 24 පුරා, දුරකථන ගාස්තු අය නොකෙරේ) |
| සිදුවීම්, අනතුරු ආදිය | පොලිස් ස්ථානය | 110 (පැය 24 පුරා, දුරකථන ගාස්තු අය නොකෙරේ) |

## 07 ▸ ජපන් සෞඛ්‍ය රක්‍ෂණය/ විශ්‍රාම වැටුප් සඳහා ලියාපදිංචි විය යුතුද?

ජපානයේදී ඉහල වෛද්‍ය සේවාවක් ලබා ගත හැකි වුවද, වෛද්‍ය වියදම් ඉතා අධිකය. එබැවින්, ජපානයේ සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමවේදය යටතේ, සියලුම ජපන් සහ විදේශික (නේවාසික පදිංචි කාලය මාස 3කට වැඩි සහ පදිංචිය ලියාපදිංචි වී ඇති අය) සෑම පුද්ගලයෙක් ම සෑම විටම කුමක් හෝ පොදු සෞඛ්‍ය රක්‍ෂණයක් ලබා ගැනීම අවශ්‍ය වේ. පොදු වෛද්‍ය රක්‍ෂණ වර්ග දෙකක් තිබේ: ජාතික සෞඛ්‍ය රක්ෂණය සහ සමාගම් ආදී රැකියා ස්ථානයෙන් ලබා ගන්නා සෞඛ්‍ය රක්‍ෂණ වේ.

ජාතික සෞඛ්‍ය රක්ෂණය යනු සමාගමක සේවය නොකරන පුද්ගලයින් සඳහා වන රක්ෂණයකි. ජපානයේ අධ්‍යාපනය ලබන විදේශීය ශිෂ්‍යයන් මෙම ජාතික සෞඛ්‍ය රක්ෂණය ලබා ගත යුතුය. ජාතික සෞඛ්‍ය රක්ෂණයක් ඇති විට, අසනීප හෝ තුවාල සඳහා ප්‍රතිකාර ලැබීමේදී, සෞඛ්‍ය රක්‍ෂණයෙන් ආවරණය වන වෛද්‍ය වියදම් සහ ඖෂධවල වියදම් ආදියෙන් 30% ක් පමණක් තමන් විසින් ගෙවිය යුතුය.

තවද, වයස අවුරුදු 20 සහ ඊට වැඩි විදේශීය ශිෂ්‍යයන් ඇතුළු විදේශිකයන් (පදිංචිය ලියාපදිංචි කර ඇති අය), ජාතික විශ්‍රාම වැටුපට ලියාපදිංචි වී රක්ෂණ වාරික ගෙවිය යුතුය. කෙසේ වෙතත්, ශිෂ්‍යයන් විසින් අයදුම් කිරීමෙන්, ගෙවීම් නිදහස් කර ගැනීමේ ක්‍රමවේදයට ඇතුළත් විය හැකිය. විශ්‍රාම වැටුප් සම්බන්ධ ලියාපදිංචි වීම, පදිංචිය ලියාපදිංචි වී සිටින නගර සභාවේදී සිදු කෙරේ.

## 08 ▶ මයි නම්බර් එක යනු කුමක්ද?

ජපානයේ වාසය කරන සහ පදිංචි සහතිකයක් ලබා ගෙන ඇති පදිංචිකරුවන්ට (විදේශීය ශිෂ්‍යයන් ආදී නේවාසික පදිංචි කාලය මාස 3 ඉක්මවන මධ්‍යම හා දීර්ඝ කාලීන පදිංචිකරුවන් ඇතුළුව) ලබා දී ඇති ඉලක්කම් 12ක අංකයකි. නීතියෙන් නියම කර ඇති සමාජ රක්ෂණ, බදු සහ ආරක්ෂණ කළමනාකරණ ක්‍රියාමාර්ග යන ක්ෂේත්‍රවල පරිපාලන ක්‍රියා පටිපාටි සඳහා පමණක් මෙය භාවිතා කරනු ලැබේ.

මයි නම්බර් කාඩ්පත (පුද්ගල අංක කාඩ්පත)




විදේශීය ශිෂ්‍යයන් විසින්, නේවාසික පදිංචි කාඩ්පත නිකුත් කිරීමෙන් පසු, පදිංචි ස්ථානය තීරණය කළ දින සිට දින 14 ක් ඇතුළත, ප්‍රදේශයේ නගර සභාවට පදිංචිය මාරු කිරීම පිලිබඳ දැනුම්දීමක් කළ යුතුය. ඉන්පසු නේවාසික ලියාපදිංචිය සිදු කෙරෙන අතර, “පුද්ගල අංකය දැනුම්දීම” ලැබෙන්නට සලස්වනු ඇත. “පුද්ගල අංකය දැනුම්දීම” යනු තමන්ගේ “මයි නම්බර්” එක දැනුම් දෙන එකක් වන අතර, මයි නම්බර් සහතිකය හෝ අනන්‍යතාවය තහවුරු කිරීමේ සාක්ෂියක් ලෙස භාවිතා කළ නොහැක.

මයි නම්බර් දැනුම් දීමෙන් පසු, නගර සභාවට අයදුම් කිරීමෙන්, “මයි නම්බර් කාඩ්පත (පුද්ගල අංක කාඩ්පත)” නම් වූ ඔබේ මුහුණේ ඡායාරූපයක් සහිත ප්ලාස්ටික් කාඩ්පතක් නිකුත් කරනු ලැබේ. මෙම තනි කාඩ්පතෙන්, ඔබගේ මයි නම්බර් එක තහවුරු කිරීම සහ අනන්‍යතාවය තහවුරු කිරීමද කළ හැක.

මයි නම්බර් එක සාමාන්‍යයෙන් මුළු ජීවිත කාලයටම එකම අංකය වනු ඇත. ඔබ ජපානයෙන් ටික කලකට පිටව ගොස්, වසර කිහිපයකට පසු නැවත ජපානයට පැමිණියද, එම අංකය වෙනස් නොවේ. මයි නම්බර් එක පහසුවෙන් කෙනෙකුට දැනුම් දීමත්, අන් අයගේ අංක එකතු කර ගබඩා කිරීමත් නොකළ යුතුය.

නමුත්, නීතියට අනුව, ශිෂ්‍යත්වයන්ට අදාළ ක්‍රියාවලි, අර්ධකාලීන රැකියා වැටුප් සහ බදු, බැංකු හරහා විදේශයන්ට මුදල් යැවීම ආදී අවස්ථාවන්හිදී, එම කාර්ය මණ්ඩලයට මෙය අංකය දැනුම් දිය යුතුය.

“මයි නම්බර් කාඩ්පත” නැති වුවහොත්, කරුණාකර වහාම පුද්ගල අංක කාඩ්පත් ඇමතුම් මධ්‍යස්ථානය වෙත දැනුම් දී, මයි නම්බර් එකේ භාවිතය තාවකාලිකව අත්හිටුවන්න. පොලිසියට දැනුම් දීමෙන් පසු, අනිවාර්යයෙන් නගර සභා කාර්යාලයේදී නැවත නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට වග බලා ගන්න.

තවද, වැඩිදුර අධ්‍යාපනය හෝ රැකියාකට යාම ආදිය හේතුවෙන් පදිංචි ස්ථානය වෙනස් වූ විට, අදාළ නගර සභාවන්ට පදිංචියෙන් ඉවත් වීම/ පදිංචි වීම දැනුම්දීමත් සමඟම, “මයි නම්බර් කාඩ්පත” හි ලිපිනය වෙනස් කිරීමේ දැනුම්දීමද කළ යුතු වේ. (නේවාසික පදිංචි කාඩ්පතෙහි ලිපිනයද වෙනස් කළ යුතු වේ.) “මයි නම්බර් කාඩ්පතෙහි” හි කල් ඉකුත්වන දිනයක් ඇත. (විදේශීය ශිෂ්‍යයන් සඳහා එය නේවාසික පදිංචි කාලසීමාව හා සමාන වේ), එබැවින් “මයි නම්බර් කාඩ්පතෙහි” කල් ඉකුත්වන දිනයට පෙර නගර සභාවේ දී එය යාවත්කාලීන කර ගන්න.
<මයි නම්බර් කාඩ්පතෙහි පොදු වෙබ් අඩවිය https://www.kojinbango-card.go.jp>

## 09 ▶ ජපානයේ අධ්‍යාපනය ලබන කාලයේදී කුමන ආකාරයේ ක්‍රියා පටිපාටි සිදුකළ යුතුද?

ජපානයේ අධ්‍යාපනය ලබන කාලයේදී විවිධ ක්‍රියා පටිපාටි සිදු කිරීමට අවශ්‍ය වේ. මෙහිදී, නේවාසික පදිංචි කාලය අලුත් කිරීම, තාවකාලිකව ජපානයෙන් පිටතට ගොස් නැවත ඇතුල්වීමේ අවසරය සහ අර්ධකාලීන රැකියා සඳහා නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය සඳහා වන ක්‍රියා පටිපාටිය හඳුන්වා දෙන්නෙමු. වැඩි විස්තර සඳහා, කරුණාකර ළඟම ඇති ආගමන විගමන කාර්යාලය අමතන්න.

① නේවාසික පදිංචි කාලය අලුත් කිරීම

අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනය ලබන අතරතුර නේවාසික පදිංචි කාලය අවසන් වන්නේ නම්, ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයේදී නේවාසික පදිංචි කාලය අලුත් කිරීමේ අවසරය සඳහා ඉල්ලුම් කළ යුතුය (නේවාසික පදිංචි කාලය අවසන් වීමට මාස 3 කට පෙර සිට අයදුම් කළ හැකිය). මෙම අවස්ථාවේදී, වැදගත් කරුණු වන්නේ ඔබ අධ්‍යාපනය ලබන පාසලේ අධ්‍යාපන ප්‍රතිඵල, පැමිණීමේ තත්ත්වය සහ ජපානයේ නේවාසික පදිංචි තත්ත්වයයි. විශේෂයෙන්, පැමිණීම දුර්වල නම් හෝ කාල සීමාවෙන් ඔබ්බට අර්ධකාලීන රැකියා (නේවාසික තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම්) කර ඇත්නම්, නේවාසික පදිංචි කාලය අලුත් කිරීමට අවසර නොලැබිය හැකි බැවින් කරුණාකර සැලකිලිමත් වන්න. නේවාසික පදිංචි කාලය අලුත්කිරීමේ ක්‍රියා පටිපාටිය සිදු නොකර, අවසර ලද නේවාසික පදිංචි කාලයෙන් ඔබ්බට ජපානයේ රැඳී සිටියහොත් (නීතිවිරෝධී රැඳී සිටීම), නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දැඩි දඬුවම් ලැබෙනු ඇත.

② තාවකාලිකව ජපානයෙන් පිටතට ගොස් නැවත ඇතුල්වීමේ අවසරය

ජපානයේ අධ්‍යාපනය ලබන අතරතුර තාවකාලිකව ඔබේ මව්රටට යාමට අවශ්‍ය නම්, "නැවත ඇතුල්වීමේ විශේෂ අවසරය" ක්‍රමවේදය යටතේ, "නේවාසික පදිංචි කාඩ්පත" ඇති අයෙකු ජපානයෙන් පිටවී වසරක් ඇතුළත ජපානයට නැවත ඇතුල් වන්නේ නම්, සාමාන්‍යයෙන් නැවත ඇතුල්වීමේ අවසරයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. නැවත ඇතුල්වීමේ විශේෂ අවසරය සහිතව ජපානයෙන් පිටවන විට, අනිවාර්යයෙන්ම විදේශ ගමන් බලපත්‍රය සහ නේවාසික පදිංචි කාඩ්පත පෙන්වා, නැවත ඇතුල්වීමේ ආගමන විගමන ලේඛනයේ (ED කාඩ්පත) හි, "1. තාවකාලික පිටවීමකි, නැවත ඇතුල්වීමට බලාපොරොත්තු වෙමි" හි චෙක් සලකුණ යොදන්න.

නැවත ඇතුල්වීමේ විශේෂ අවසරයක් සහිතව ජපානයෙන් පිටව ගිය පුද්ගලයෙකුට, එහි වලංගු කාලය (වසරක්) විදේශයක සිට දීර්ඝ කළ නොහැක. ජපානයෙන් පිටවී වසරක් ඇතුළත නැවත ජපානයට ඇතුළු නොවුනහොත්, නේවාසික පදිංචි සුදුසුකම අවලංගු වනු ඇත. එබැවින් වසරක් හෝ ඊට වැඩි කාලයක් ජපානයෙන් පිට රැඳී සිටින්නේ නම්, කරුණාකර නැවත ඇතුළුවීමේ අවසරයක් සඳහා අයදුම් කරන්න. තවද, ඔබ ජපානයෙන් පිටව යන දින සිට නේවාසික පදිංචි කාලසීමාව දක්වා කාලය වසර 1කට වඩා අඩු වේ නම්, නේවාසික පදිංචි කාලසීමාව වන විට ජපානයට නැවත ඇතුළු වී, නේවාසික පදිංචි කාලය අලුත් කිරීම ආදිය සඳහා අයදුම් කරන්න.

තවද, නේවාසික පදිංචි කාඩ්පත් නිකුත් කරන ගුවන්තොටුපළකින් හැර වෙනත් ගුවන්තොටුපළකින් ගොඩබැසීමේ අවසරය ලැබී, තවමත් නේවාසික පදිංචි කාඩ්පතක් ලබා ගෙන නොමැති විට වුවද, "නේවාසික පදිංචි කාඩ්පතක් පසුවට නිකුත් කෙරේ" යන සටහනක් සහිත විදේශ ගමන් බලපත්‍රයකින්ද, නැවත ඇතුල්වීමේ විශේෂ අවසරය මගින් ජපානයෙන් පිටවිය හැකි ය. විදේශිකයන්ගේ ආගමන වාර්තා, මාර්ගගත ක්‍රමයට ද අයදුම් කිරීමට හැකි වී තිබේ.
https://www.moj.go.jp/isa/applications/translation.html

③ අර්ධකාලීන රැකියා සඳහා නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය

ජපානයේ අධ්‍යාපනය ලබන අතරතුර අර්ධකාලීන රැකියාවක් කිරීමට අවශ්‍ය නම්, ඊට පෙර අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයේ දී අර්ධකාලීන රැකියාවක් කිරීම සඳහා, නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය ලබා ගත යුතුය. මෙම අවසරය නොමැතිව අර්ධකාලීන රැකියාවක් කළහොත්, නීති විරෝධී රැකියා කිරීම වෙනුවෙන් දැඩි දඬුවම් ලැබෙනු ඇත.

තවද, "විදේශීය ශිෂ්‍ය" යන නේවාසික පදිංචි සුදුසුකම යටතේ අළුතින් ගොඩබැසීමේ බලපත්‍රයක් ලැබුවේ නම්, ගොඩබැසීමේ තොටුපළින්ම (නේවාසික පදිංචි කාඩ්පත් නිකුත් කරන ගුවන්තොටුපළට සීමා වේ) මෙම නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය සඳහා ඉල්ලුම් කළ හැකිය.

## 10 ▶ විදේශීය ශිෂ්‍යයන් අවධානයෙන් සිටිය යුතු කරුණු මොනවාද?

ජපානයේ විදේශීය ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනය ලැබීම සඳහා, අවනත විය යුතු නීති රීති සහ රෙගුලාසි බොහෝ තිබේ. තවද, ජපානය හැර වෙනත් රටවල නීති විරෝධී නොවන දේ, ජපානයේ නීති විරෝධී වන අවස්ථාද තිබේ. විදේශීය ශිෂ්‍යයන් අවම වශයෙන් ප්‍රවේශම් විය යුතු කරුණු කිහිපයක් මෙහිදී හඳුන්වා දී ඇත.

① අධ්‍යාපන ආයතනයට පැමිණීම පිළිබඳව


අධ්‍යාපන ආයතනය විසින් නම් කරන ලද දේශන වලට මූලික ලෙස අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය. පැමිණීමේ ප්‍රතිශතය අඩු නම්, ඉහලට සමත් වීමට හෝ උපාධිය ලබා ගැනීමට නොහැකි විය හැකිය. තවද, නේවාසික පදිංචි කාලය අලුත් කිරීමට හෝ නේවාසික පදිංචි සුදුසුකම වෙනස් කිරීමට අවසර නොලැබෙන අවස්ථාද ඇත.

② නීතිවිරෝධී රැකියා පිළිබඳව

ජපානයට පැමිණෙන විදේශීය ශිෂ්‍යයන්ගේ අරමුණ අධ්‍යාපනයයි. අර්ධකාලීන රැකියා සඳහා, පුද්ගලිකව ඉල්ලුම් කර, අවසර ලැබූ අය අවසර ලත් පරාසය තුළ එය සිදු කළ හැකිය. අවසරයකින් තොරව හෝ අවසර ලත් සීමාවෙන් ඔබ්බට අර්ධකාලීනව රැකියා සිදුකළ හොත්, නීති විරෝධී රැකියා සිදුකිරීමේ වරදට හසුවේ. නීතියට අනුව, විදේශීය ශිෂ්‍යයන් නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරය මගින් අනුමත නොකරන ස්ථානයක හෝ, නේවාසික සුදුසුකම් තත්ත්වයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා වූ අවසරයක් නොමැතිව, හෝ අවසර ලත් කාලය ඉක්මවා අර්ධකාලීන රැකියාවක් කළහොත්, නීතිය උල්ලංඝණය කිරීමක් ලෙස සලකා දඬුවම් (බරපතල වැඩ සහිත සිරදඬුවම්, සිරදඬුවම් හෝ දඩ ගෙවීම්) ලැබෙනු ඇත. එපමණක් නොව, අධ්‍යාපන ආයතනයෙන් නෙරපා, තම මව්රටට නැවත යාමට සිදු වේ. කිසිසේත්ම එවැනි තත්ත්වයකට පත් නොවීමට සැලකිලිමත් වන්න.

③ නීතිවිරෝධීව රැඳී සිටීම පිළිබඳ

නීතිවිරෝධී රැකියා මෙන්ම, විදේශීය ශිෂ්‍යයන් ප්‍රවේශම් විය යුතු කරුණක් වන්නේ නේවාසික පදිංචි කාලයයි. නොසැලකිලිමත්ව එක් දිනක් හෝ නේවාසික පදිංචි කාලය ඉක්මවා ගියහොත්, එය නීතිවිරෝධී රැඳී සිටීමක් වන බැවින්, රටින් පිටුවහල් කිරීමටද යටත් වනු ඇත. අධ්‍යාපනය අවසන් වීමෙන් පසු, වැඩිදුර අධ්‍යාපනයට යාමට අවශ්‍ය නම්, නේවාසික පදිංචි කාලය අලුත් කළ යුතුය. රැකියාවක් කිරීමට අවශ්‍ය නම්, නේවාසික පදිංචි සුදුසුකම වෙනස් කළ යුතුය. රටින් පිටුවහල් කරනු ලැබුවහොත්, නිශ්චිත කාලයක් සඳහා ජපානයට ඇතුළු වීමට නොහැකි වනු ඇති අතර, ඉන්පසුව ඇතුල්වීම සඳහාද අවාසිදායක විය හැකිය.



**නීතිවිරෝධී රැඳී සිටීමක් වන අවස්ථා**

- වැඩිදුර අධ්‍යාපනයට පිවිසීමෙන් පසු හෝ අධ්‍යාපන ආයතනයේ සිටියදීම නේවාසික පදිංචි කාලය අවසන් වී, එම කාල සීමාව තුළ අලුත් කිරීමේ ක්‍රියා පටිපාටිය සම්පූර්ණ නොකළේ නම් (අමතක වීමෙන් හෝ)
- අධ්‍යාපනය අවසන් කර තම මව්රටට යාමට බලාපොරොත්තු වන මුත්, නේවාසික පදිංචි කාලය තුල ජපානයෙන් පිට නොවූයේ නම්(නේවාසික පදිංචි කාලය තුළ වුවද "විදේශීය ශිෂ්‍ය" ක්‍රියාකාරකම්වල නිරත නොවන්නේ නම්, එය නේවාසික පදිංචි සුදුසුකම අවලංගු කිරීමකට යටත් විය හැකිය.)

එවැනි තත්වයක් වළක්වා ගැනීම සඳහා ජපානයේ අධ්‍යාපනය ලබන අතරතුර, නේවාසික පදිංචි කාලය නිසිලෙස රැකීමට වග බලා ගන්න.

④ වෙනත්

- අධ්‍යාපන ආයතනය වෙනස් කළ විට, ඉන් අස් වූ විට හෝ උපාධිය ලබා ගත් විට, ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශය වෙත "අනුබද්ධ (ක්‍රියාකාරකම්) ආයතනය පිළිබඳ දැනුම්දීම" ඉදිරිපත් කරන්න. (දින 14ක් ඇතුළත)
- නිවසින් පිටතට යන විට අනිවාර්යයෙන් "නේවාසික පදිංචි කාඩ්පත" රැගෙන යාමට වග බලා ගන්න.
- කරුණාකර ඔබේ "නේවාසික පදිංචි කාඩ්පත" හෝ "මයි නම්බර් කාඩ්පත" අන් අයට ණයට දීමෙන් හෝ ලබා දීමෙන් වලකින්න.
- "නේවාසික පදිංචි කාඩ්පත" නැති වුවහොත්, වහාම (දින 14ක් ඇතුළත) ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශයේදී නැවත නිකුත් කිරීම සඳහා අයදුම් කරන්න.
- මයි නම්බර් කාඩ්පත නැති වුවහොත්, කරුණාකර ඒබව පොලිසියට වාර්තා කර, ඉන්පසු පදිංචි ප්‍රදේශයේ නගර සභාවට දැනුම් දී නැවත නිකුත් කරවා ගන්න.

තවද, "මයි නම්බර් කාඩ්පත" හි කල් ඉකුත්වන දිනයක් (නේවාසික පදිංචි කාලය හා සමාන) ඇත. කරුණාකර කල් ඉකුත්වන දිනයට පෙර, නගර සභා කවුන්ටරයේ දී කල් ඉකුත් වීමේ දිනය දීර්ඝ කිරීමේ ක්‍රියා පටිපාටිය සිදු කරන්න.

⑤ ජීවන රටාවේ සහ නීතිරීති වල වෙනස්කම්

ඔබගේ මව්රටෙහි සාමාන්‍ය දෙයක් වුවද, ජපානයේ දී නොකළ යුතු හෝ නීති විරෝධී ක්‍රියාවක් බවට පත්විය හැකිය. එවැනි කිහිපයක් මෙහිදී හඳුනා ගනිමු.

- පාරේ දමා ඇති පාපැදි හෝ වෙනත් අතහැර දැමූ භාණ්ඩ අවසරයකින් තොරව භාවිතා නොකරන්න.
- ඔබේ ශිෂ්‍ය හැඳුනුම්පත, ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත හෝ නේවාසික පදිංචි කාඩ්පත, අන් අයට තාවකාලිකව දීම හෝ අන් අයගෙන් ගැනීම නොකළ යුතුය.
- මධ්‍යම රාත්‍රියේ අසල්වාසීන්ට බාධාවක් විය හැකි ලෙස උස් හඬින් කතා කිරීමෙන් වලකින්න.
- ජපානයේදී, වයස අවුරුදු 20ට අඩුනම්, මත්පැන් හෝ දුම් පානය නොකළ යුතුය.
- පොදු ප්‍රවාහන සේවාවන් (දුම්රිය, බස්රථ) තුලදී, ජංගම දුරකථන භාවිතයෙන් ඇමතුම් ගැනීමෙන් වළකින්න.

# 11 ▶ නව කොරෝනා වෛරසය ආසාදනය වුවහොත් කළ යුතුදේ

මේ වන විට, නව කොරෝනා වෛරස ආසාදනය පැතිරීම හේතුවෙන්, ජපානයට පැමිණීම සහ ජපානයේ අධ්‍යාපනයට විශාල බලපෑමක් එල්ල වී ඇත. ජපානයේ අධ්‍යාපනය ලැබීමට කැමති අය සඳහා, ජපානයට පැමිණීමට හැකි වන තෙක්, ඔන්ලයින් අධ්‍යයනය ලබා දෙන අධ්‍යාපන ආයතනද ඇත. ජපානයේ අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් පහත හඳුන්වා දී ඇති "කොරෝනා වෛරස ආසාදනය සම්බන්ධ තොරතුරු සැපයීම" යන එක් එක් වෙබ් අඩවි මගින් නවතම තොරතුරු සපයා ඇති බැවින්, කරුණාකර පරීක්ෂා කර බලන්න.

## ◆ නව කොරෝනා වෛරස ආසාදනය සම්බන්ධ තොරතුරු සැපයීම

- දේශසීමා පාලනය පිළිබඳ නව පියවර
  (සෞඛ්‍ය කම්කරු හා සුබසාධන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය)
https://www.mhlw.go.jp/stf/seisakunitsuite/bunya/0000121431_00209.html

- නව කොරෝනා වෛරස ආසාදනය පැතිරීම වැළැක්වීම සඳහා ගොඩබෑසීම ප්‍රතික්ෂේප කිරීම ආදියට අදාලව
  (ජපානයේ ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවිය) https://www.moj.go.jp/isa/hisho06_00099.html

- නව කොරෝනා වෛරස ආසාදන පිළිබඳව විදේශීය ශිෂ්‍යයන් සහ ජපන් භාෂා අධ්‍යයන ආයතන හා සම්බන්ධ තොරතුරු
  (ජපානයේ ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවිය) https://www.moj.go.jp/isa/nyuukokukanri01_00157.html

- ජපානයේ පදිංචි විදේශීය ශිෂ්‍යයන් සඳහා උපකාරක තොරතුරු
  (අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය) https://www.mext.go.jp/a_menu/koutou/ryugaku/1405561_00006.htm

## ◆ විදේශිකයන් සඳහා උපදේශන සේවා

(ටෝකියෝහි වෙසෙන විදේශිකයන් සඳහා, ආගමන තොරතුරු, විවාහය/ පුරවැසිභාවය, රැකියා වැනි දෛනික ජීවිතය පිළිබඳ විවිධ උපදේශන ලබා දේ.)

| උපදේශන භාෂාව | උපදේශන දින (නිවාඩු දින හැර) | උපදේශන කාලය | දුරකථනය |
|---|---|---|---|
| ඉංග්‍රීසි | සඳුදා සිට සිකුරාදා දක්වා | 9: 30-12: 00<br>13: 00-17: 00 | +81-3-5320-7744<br>(ජපානය තුල සිට 03-5320-7744) |
| චීන | අඟහරුවාදා / සිකුරාදා | | +81-3-5320-7766<br>(ජපානය තුල සිට 03-5320-7766) |
| කොරියානු | බදාදා | | +81-3-5320-7700<br>(ජපානය තුල සිට 03-5320-7700) |

- ජීවන සංස්කෘතික සහ ක්‍රීඩා කාර්යාංශයේ, ටෝකියෝහි ජීවන ප්‍රජා ක්‍රියාකාරකම් ප්‍රවර්ධන අංශය, තෝකියෝ මෙට්‍රොපොලිටන් පළමු ප්‍රධාන ගොඩනැගිල්ලේ 3 වන මහල, 2-8-1, නිෂි-ශින්ජුකු, ශින්ජුකු-කු, 163-8001

* දුරකථනයෙන් උපදේශන ලබා ගත හැකිය. කාර්යාංශයට පැමිණෙන්නේ නම්, කරුණාකර ඊට පෙර දැනුම් දෙන්න.

- විදේශිකයන් සඳහා නේවාසික උපකාරක මධ්‍යස්ථානය (FRESC) https://www.moj.go.jp/isa/support/fresc/fresc01.html

(විදේශිකයන්ගේ නේවාසික පදිංචිය සම්බන්ධයෙන් විවිධ උපදේශන ලබා ගත හැක. විස්තර සඳහා HP බලන්න.)
යොත්සුයා ගොඩනැගිල්ල 13 වන මහල, 1-6-1, යෝත්සුයා, ශින්ජුකු-කු, 160-0004 දුරකථනය +81-3-5363-3013 (ජපානය තුල සිට Navi dial 0570-011000)

## අදාළ ජපානයේ එක් එක් සංවිධානයන්ගේ වෙබ් ලිපින

- අධ්‍යාපන සංස්කෘතික ක්‍රීඩා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (අධ්‍යාපන පරිපාලන ආයතනය) https://www.mext.go.jp/
- විදේශ කටයුතු අමාත්‍යාංශය (රාජ්‍යතාන්ත්‍රික පරිපාලන ආයතනය) https://www.mofa.go.jp/mofaj/
- අධිකරණ අමාත්‍යාංශය (නීති පරිපාලන ආයතනය) https://www.moj.go.jp/
- ජපානයේ ආගමන විගමන කාර්යාංශය
  (අධිකරණ අමාත්‍යාංශයේ බාහිර නියෝජිතායතනය, ආගමන විගමන කාර්යාංශය) https://www.moj.go.jp/isa/index.html
- ජපාන ශිෂ්‍ය උපකාරක සංවිධානය
  (ජපානයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා වූ ප්‍රවේශ විභාගය / ජපානයේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව) https://www.jasso.go.jp/
- ජපාන ජාත්‍යන්තර අධ්‍යාපනික හුවමාරු උපකාරක සංගමය https://info.jees-jlpt.jp/
  (ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය, විදේශීය ශිෂ්‍ය නිවාස සඳහා සියලු වන්දි, ආදිය) http://jees.or.jp/
- ජපානයේ කන්ජි යෝග්‍යතා පරීක්ෂණ සංගමය (BJT ව්‍යාපාර ජපන් භාෂා ප්‍රවීණතා පරීක්ෂණය) https://www.kanken.or.jp/bjt/
- ජපන් භාෂා අධ්‍යයන ප්‍රවර්ධන සංගමය (ජපන් භාෂා අධ්‍යයන ආයතනය) https://www.nisshinkyo.org/
- ටෝකියෝ වෘත්තීය විවිධ අධ්‍යාපන සංගමය (ටෝකියෝ වෘත්තීය අධ්‍යාපන ආයතනය) https://tsk.or.jp/multi/index.php
- ජපානයේ වෘත්තීය විවිධ අධ්‍යාපන ආයතන සම්මේලනය
  (ජපානය පුරා ඇති වෘත්තීය අධ්‍යාපන ආයතන) https://zensenkaku.gr.jp/zensen_index.cgi
  https://study-japan-ptc.jp/

## නේවාසික විදේශිකයන් සඳහා ජීවන තොරතුරු ආදිය

- ටෝකියෝ ජීවන සංස්කෘතික සහ ක්‍රීඩා කාර්යාංශය, පුරවැසි ජීවන අංශය ・පත්‍රිකාව "Life in Tokyo : Your Guide"
  https://www.seikatubunka.metro.tokyo.lg.jp/chiiki_tabunka/tabunka/tabunkasuishin/0000000945.html
- ටෝකියෝ බහු සංස්කෘතික සහජීවන දොරටු වෙබ් අඩවිය https://tabunka.tokyo-tsunagari.or.jp/index.html

**ජපානයේ විදේශීය ශිෂ්‍ය ජීවිතය පිළිබඳ මූලික දැනුම 2023**

ලියාපදිංචි අංකය (5) 10

**2023 ජූනි 30 දින ප්‍රකාශයට පත් කරන ලදී**

| | |
|---|---|
| සංස්කරණය / ප්‍රකාශය | ටෝකියෝ ජීවන සංස්කෘතික කාර්යාංශය පුද්ගලික අධ්‍යාපන ආයතන පරිපාලන අංශය<br>2-8-1, නිෂි-ශින්ජුකු, ශින්ජුකු-කු, ටෝකියෝ, 163-8001<br>දුරකථනය 03 (5320) 7724 |
| මුද්‍රණාලය | මියාගවා මුද්‍රණ සමාගම<br>1-57-2, යොයෝගි, ෂිබුයා-කු, ටෝකියෝ, 151-0053<br>දුරකථනය 03 (5358) 2787  ෆැක්ස් 03 (5358) 2797 |




リサイクル適性Ⓐ
この印刷物は、印刷用の紙へリサイクルできます。

石油系溶剤を含まないインキを使用しています。

**ජපානයේ විදේශීය ශිෂ්‍ය ජීවිතය පිළිබඳ පූර්ව දැනුම 2023**

ටෝකියෝ / විදේශීය ශිෂ්‍යයන්ගේ නීති විරෝධී ක්‍රියාකාරකම් වැලැක්වීම සඳහා වූ සම්බන්ධතා කවුන්සිලය